# පළමු ලම්බකර්ණ රාජවංශිකයන් හා ආර්ථිකය පුනර්ජනනය විෂයෙහි ඔවුන්ගේ දායකත්වය පිළිබඳ විමසුමක්

ගල්වැවේ විමලඛන්ති හිමි

## හැඳින්වීම

වසභ රාජෝදයත් සමග ඇරඹී මෙරට පළමු ලම්බකර්ණ පරපුර මහානාම රජුගේ පාලනය අවසන් වන තෙක් පැවති බව පැහැදිලි වේ. ඔවුන් සිය පාලන කාර්යයේදී වැඩි වශයෙන් ම ජනහිතකාමී ප්‍රතිපත්තියක් ගෙන ගියහ. එකී ජනහිතකාමී ප්‍රතිපත්තිය ප්‍රධාන වශයෙන් ආර්ථිකය ශක්තිමත් කිරීම විෂයෙහි බලපැවැත්තේ ය. මේ පර්යේෂණය මගින් පොදුවේ ලම්බකර්ණ රාජවංශිකයන්ගේ මුල් පාලන යුගය පිළිබඳ විවරණයක් අඩංගු වෙයි. තව ද ඔවුන් ආර්ථිකය විෂයෙහි දැක්වූ දායකත්වය ද මෙහිදී විමර්ශිත ය.

## සාකච්ඡාව

නව රාජවංශය ස්ථාවරව ආරම්භ කරන්නේ වසභ රජතුමා ය (ක්‍රි.ව.67-111). එම රජු ප්‍රධාන වශයෙන්ම යුද්ධයේ දී පමණක් නොව පාලන කාර්යයෙහි ද දක්ෂයෙක් බව ඔප්පු කොට තිබේ. ඒ වන විට ආරම්භව තිබූ ගම් වැව් කර්මාන්තය මහ වැව් කර්මාන්තයක් බවට පරිවර්තනය කිරීමේ පුරෝගාමියා වන්නේ වසභ රජතුමා ය. ඔහු වැව් එකොළසක් (11) හා ඇලවල් දොළසක් (12) ද කර වූ බව මහාවංශය වාර්තා කරයි (ම.ව.35:95). මෙම මහාවංශ විස්තරය සත්‍යක් බව දැනට ඔහුගේ නමින් හඳුනාගෙන ඇති වැව් වලින් පෙනේ. මයන්ත (මහවිලච්චිය වැව) මහානික්ඛවට්ටි (මනාකුටි) කාළිවාපි (කාළිවසාකාලිය වදන) චථමංගණ (මංගුනු/ නොච්චිපොතාන) අග්ගිවඩ්ඩමානක (අක්වඩුන්න/ හිරිවඩුන්න) යන වැව් දැනට හඳුනාගෙන තිබේ. රාජුප්පුල (රතුපුල) කොළම්බහාලක නොහොත් (කොළොම්ගලු) කෙහාල (කොහාල) ජම්බුටි (චම්බුටි) මහාරමෙත්ති (හිතුපත්පාන) මහා පත්පහන් වැව යන වැව් ද ඇළහැර ඇල

(ආලිසාර නොහොත් යෝධ ඇල ද) ඔහු විසින් කරවන ලද වැව් හා ඇලවේලි වශයෙන් හඳුනාගෙන තිබේ. (නිකොලස්.සී.ඩබ්ලිව්.: 1964:272) කෙසේ වෙතත් මූල බ්‍රාහ්මී යුගයේදී හඳුනාගෙන තිබෙන්නේ අනුරාධපුර යුගයේ රජවරුන් විසින් සෑද වූ බවට හඳුනාගන්නා ලද වැව් තුනක් පමණි. එහෙත් වංසකථාවල ඊට වැඩි වැව් ප්‍රමාණයක් පිළිබඳව සඳහන් වේ. රුහුණෙන් සුන්දරීවාපි, හම්බන්තොට විහාරවාපි, වව්නික්කුලම පෙළවාපි, සමන්වැව (සුමනවාපි) දූරතිස්සකවාපි, කුලත්ථවාපි නොහොත් කලතා වැව යනු එම වැව් වේ (නිකොලස් සී. ඩබ්.1965:270). එහෙත් මෙම වාරි ව්‍යාපාර පිළිබඳව ශිලාලේඛන ආදී වඩාත් පිළිගැණෙන ශාක්ෂ්‍ය මඟින් තහවුරු වී නොමැත. වංශකථාවෙහි ද එම යුගයේ වාරි ව්‍යාපාරයට ප්‍රමුඛස්ථානයක් ලබා දීමෙන් වර්ධනය කළ බවක් සඳහන් නොවේ. වසභ රජුගේ පටන් නව රාජවංශය ජනතාවගේ සුඛ විහරණය සඳහා ආර්ථිකය පණගැන්වීම කෙරෙහි අවධානය වැඩි වශයෙන් යොමු කළ බව පෙනේ. එමෙන්ම වසභ රජ තම රාජ්‍ය පදවිය සඳහා මහා විහාරික භික්ෂූන්ගේ ද ආධාර උපකාර ලබාගත් බව වංශකථා සාධකවලින් තහවුරු වන නිසා එකී ආරාමයන් කෙරෙහි ද මහත් ළැදිව ක්‍රියා කොට තිබෙන බව එම ආරාමවලට ලබාදෙන ලද වැව් ආදියෙහි බදු ආදායම් ආදියෙන් සනාථ වේ.

වසභ රජතුමා රටෙහි රාජ්‍යයත් එහි ස්ථාවරත්වයත් උදෙසා ද ක්‍රියා කළ බව පෙනේ. තම අගමෙහෙසිය වශයෙන් තම ජීවිතය ගලවා ගැනීමට උපකාර කළ සභ රජුගේ සෙන්පතියාගේ බිරිඳ හෙවත් සිය මලණුවන්ගේ බිරිඳ සරණ පාවා ගත් අතර තම පුතු වංකනාසිකතිස්සට සභ රජුගේ දියණිය සරණ පාවා දීමට ක්‍රියා කිරීමෙන් ඒ බව සනාථ වේ. වසභ රාජ්‍ය සමය තුළ යාපනයේ නාගදීපය තම ඉසගිරිය නම් අමාත්‍යවරයා ලවා පාලනය කිරීමට ක්‍රියා කළ බව ප්‍රකට වල්ලිපුරම් රන් සන්නසින් සාධක එල වේ (Paranavitana S.1983:31). තව ද රෝහණයේ තිස්සමහාරාමයේහි ද එම රජුට අයත් ශිලා ලේඛන හමුවේ. මේ නිසා ඉතා ශක්තිමත් රාජ්‍ය තන්ත්‍රයක් මුළු ලක්දිව පුරාම ඇතිකිරීමට වසභ රජුට හැකියාව ලැබිණ. අනෙක් අතට තමාගේ පාලනය ප්‍රාදේශීය පාලකයින් මගින් දිවයිනෙහි සෑම ප්‍රදේශයකම පතුරවාලීමෙන් පාලන කාර්යයෙහි තමන් දක්ෂ බව එම රජු පෙන්වා තිබේ.

මීට අමතරව නගර ප්‍රාකාරය වඩාත් උස් කොට බැඳවීමත්, වාසල් සතරෙහි ගෝපුර කරවීමත් මඟින් වඩාත් ශක්තිසම්පන්න නගර රක්ෂාවක් ද ඔහු විසින් සිදු කරන ලදි. තව ද නගරය පුරා පොළොව යටින් නළ මාර්ගයෙන් ජලය සැපයීම ද ඔහුගේ කාලයේදී සිදු වූ වැදගත් කාරණයක් විය (දී.ව.22:11). මේ නිසා එම රජුගේ රාජ්‍ය කාලය වූ වසර හතළිස් හතරක් වූ කාලපරිච්ඡේදය තුළ කිසිදු අභ්‍යන්තර හෝ බාහිර ආක්‍රමණයක් හෝ කළ කෝලාහලයක් ද වාර්තා වී නොමැති බැවින් ඔහු ප්‍රබල රජ කෙනෙක් වශයෙන් හදුනාගත හැකිය.

රටෙහි දීර්ඝ කාලයක් සාමය පවත්වාගෙන යාමට හැකි වූ බැවින් ජනතාවගේ සුභ සිද්ධිය පිණිස වැව් හා ඇළ මාර්ග ආදිය ඉදි කොට රට ස්වයංපෝෂිත කිරීමේ කටයුත්තට රජුට දායක වීමට හැකියාව ලැබිණ. වැව් හා ජලමාර්ගවලින් හඳුන්වාදෙනු ලැබූ බදු ආදිය මගින් රාජ්‍යයටත්, ආරාමවලටත් අඛණ්ඩව ධනයක් උත්පාදය විය. මෙම තත්ත්වය නිසා රට අභ්‍යන්තරයේ ආර්ථිකය ඉහළ මට්ටමකට ගෙන ඒමට හැකියාව ලැබුණු බව පසක් වේ. අනෙක් අතට වසභ රාජයොාදයේ ඇති වූ ආර්ථික දියුණුව ඔහුගේ අනුප්‍රාප්තිකයන් විෂයෙහි ද පැතිරී යාමට බලපෑමක් කළ බව පසක් වේ.

වසභ රජුගේ පුත්‍රයන් පිළිබඳව විමසීමේදී වංශකථාවල නොසටහන් තවත් පුතුන් දෙදෙනෙක් එම රජුට අයත් ශිලාලේඛන වලින් හදුනාගත හැකිව තිබේ. හබැස්ස ශිලා ලේඛනයෙහි වසභ රජුගේ මුණුබුරු වූ නක නම් උපරාජ කෙනෙක් පිළිබඳව කියැවේ. මෙම නක "උත්තර නම් රජු"ගේ පුත්‍රයා ය. එවිට වසභ මහ රජුගේ පුත්‍රයා උත්තර රජ නම් වේ. මේ ශිලාලේඛනයෙහි වසභ රජුට " මහරජ" යනුවෙන් "උතර මහරජ පුත" වශයෙන් යෙදී තිබෙන නිසාත් උතර ද මහරජ වශයෙන් හදුන්වා දී ඇත. එහෙත් පුත්‍රයා "නක" පැහැදිලිවම යුවරජ වංශයෙන් දක්වා තිබේ (EZ.Vol.IV:217). කෙසේ වෙතත් උතර, මහරජ හෝ රජ වශයෙන් ප්‍රාදේශීය පාලකයෙක් ලෙස ක්‍රියා කර ඇති බව පැහැදිලි වේ. තව ද පරණවිතාන උත්තර යනු වංකනාසිකතිස්ස රජුගේ තවත් එක් නමක් විය හැකි බවට ද පුතෙක් විය හැකි බවට ද අදහස් දක්වා තිබේ. (ibid(215) තව ද කුරුණෑගල දිස්ත්‍රික්කයේ තම්මැන්නාගාමෙන් ලද ශිලාලේඛනයක වසභ

මහරජුගේ පුත්‍රයකු වූ 'දුටග' නම් මහ රජ කෙනෙක් පිළිබඳව සටහන් වේ. (ASCAR:1934:3:Paranavithana S.1933:83) එයින් දුටග මහරජ යනුවෙන් යොදා තිබෙන ශිලාලේඛනයක් නිසා ඔහු මහරජ වශයෙන් ක්‍රියා කොට තිබෙන බව පසක් වේ. කෙසේ වෙතත් වසභ රජු ප්‍රාදේශීය පාලකයන් යොදාගෙන රට පාලනය කළ බව නොරහසකි. ඒ අනුව දුටග ද රජුගේ පුත්‍රයෙකු වූ ප්‍රාදේශීය පාලකයෙක් විය හැකි ය. එහෙත් මහරජ වශයෙන් නොදා තිබීම නිසා පූර්ණ ස්වාධීන පාලන තන්ත්‍රයක් ඔහු ගෙන ගියේ ද යනු විසඳා ගත නොහැකි ගැටලුවක් වී තිබේ. මෙම කරුණු පිළිබඳ අවධානය යොමු කළ පරණවිතාන වසභ රජුගේ පුතුන් තිදෙනා පසුකලෙක ත්‍රිසිංහලය නමින් හඳුන්වනු ලබන කාලාප තුනෙහි එකම කාලයක මහරජ වශයෙන් සිටිමින් පාලනය ගෙනගිය බවත්, වංශකථාවේ සටහන් වන්නේ ඉන් අනුරපුර රජු ගැන පමණක් බවත් කියයි (ලං.වි.ලං.ඉ. 1964:177). කෙසේ වෙතත් පරණවිතාන දක්වන ආකාරයට තත් යුගයේ පාලන කලාප වෙන් කර ගැනීම සඳහා ශිලාලේඛනවල සටහන් වන තොරතුරු ප්‍රමාණවත් නොවන බව පෙනෙයි. අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් නැට්ටුකන්ද (c) ශිලාලිපියෙහි "උතරපුර අතනහි" වශයෙන් යෙදුමක් තිබේ. එහි උත්තරපුර ආස්ථානයෙහි වශයෙන් ඊට අර්ථ කිවහැකි වෙයි. උත්තර වශයෙන් උතුරු නගරය හෝ නගරයේ උතුර ඉන් අදහස් කළාද උතුරු පළාත අදහස් කළේ ද යන්න පැහැදිලි නොවේ (Paranavithana S.2001:235). මේ නිසා තත් යුගයේ පාලන ප්‍රදේශ පිළිබඳ පැහැදිලිතාවයක් ඇති කර ගැනීමේ අපහසුතා පවතින බව ඉන් ප්‍රත්‍යක්ෂ වේ. මේ සඳහා කදිම නිදසුනක් අම්පාර දිස්ත්‍රික්කයේ දිවියාගල ආරණ්‍ය සේනාසනයේ මෑතකදී සොයා ගත් බෙහෙවින් විනාශ වී ගිය ශිලාලේඛනයක සටහන් වී තිබේ. එහි සටහන් වන ආකාරයට "සිද්ධ පජින පුරතහි රටිය තමහ නක පහණ වවි" වශයෙන් යෙදුමක් තිබේ. එවිට එම ප්‍රදේශය පජිනපුරතහි රටිය වශයෙන් යෙදී තිබෙන බැවින් හා නැගෙනහිර පුරයෙහි රටිය හෙවත් ප්‍රාදේශීය රාෂ්ට්‍ර පාලකයා ඉන් අදහස් කළ බව කියැවෙන බැවින් උක්ත පැනයට පිළිතුරු ලැබේ. මේ ශිලා ලේඛනය ක්‍රි.ව. දෙවන සියවසට පමණ අයත් කළ හැකිවේ (විමලබන්ති හිමි ජී.2018:234). මේ නිසා ප්‍රදේශ පිළිබඳ පැහැදිලිතාවයක් ඇති කර ගැනීම සඳහා තත් යුගයේ ප්‍රදේශ සීමා ආදිය අවබෝධ කරගැනීමට ප්‍රමාණවත් සාධක සොයා ගැනීම අපහසු වී ඇති බව පෙනේ.

වසභ රජුගෙන් පසු ඔහු පුත් වංකනාසිකතිස්ස කුමරු රාජ්‍ය පදප්‍රාප්ත විය. එහෙත් එම රජුගේ වර්ෂ තුනක කාල පරිච්ඡේදය ආර්ථික දියුණුව උදෙසා කළ කී යමක් පිළිබඳ මහාවංසයේ සටහන් නොවේ. රෝහණ ගංතෙර මහා මංගල නම් විහාරය කළ බව පමණක් එම රජු පිළිබඳව මහාවංශයෙහි සටහන් වේ (ම.ව.35:133). එහෙත් රාජාවලියෙහි දැක්වෙන ආකාරයට සොළී රජු සේනාවක් සමග ලංකාවට ගොඩ බැස සිරකරුවන් දොළොස් දහසක් (12,000) ගෙන දකුණු ඉන්දියාවට ගිය බව සටහන් කරයි (රා.ව.සූරවීර.ඒ.වී.1997:193). කෙසේ වෙතත් ගජබාහු රජුගේ විස්තර හා වංකනාසිකතිස්ස රජුගේ විස්තර ඉතිහාස ලේඛකයන් යම් ව්‍යාකූලතාවයකින් රචනා කොට තිබෙන බව පසක් වේ.

තුන් අවුරුදු වංකනාසිකතිස්ස රජුගේ පාලන කාලය අවසන් වීමෙන් පසු යළි රජ වූයේ ඔහු පුත් ගජබාහුක ගාමිණී අභය රජතුමා ය. ගජබාහු රජුගේ රාජ කාලය ද මෙරට ඉතිහාසයෙහි ශක්තිමත් රාජ්‍ය කාලයක් විය. එම රජුගේ රාජ්‍ය කාලයේ දී රටෙහි ආර්ථික පුනර්ජීවනය සඳහා කළ කටයුතු අතර වැවක් කරවීම පිළිබඳව මහාවංශයේ සඳහන් වෙයි. ඒ ගැමුණු තිස්ස වාපි නම් වැවයි (ම.ව.35:120). එහෙත් මච් රජිණ ගාමිණී නම් තඩාගයක් කළ බව දීපවංසයෙහි සටහන්ව තිබේ (දී.ව.22:13). ඒ හැරුණු විට ආගමික පුනර්ජීවනය සඳහා කළ කටයුතු වැඩි වශයෙන් මෙම රජුට අදාළව වංශකථාවන්හි සටහන්ව තිබේ.

වංශකථාදියෙහි සටහන් නොවූව ද වංකනාසිකතිස්ස රජුගේ රාජ්‍ය කාලයේ සොළී රටට ගෙන යන ලද දොළොස් දහසක් තරම් වූ සේනාව හා ඊට හිලව් පිණිස තවත් දොළොස් දහසක් සේනාව ද පාත්‍රා ධාතුව හා පත්තිනි දේවියගේ රුවන් සළඹ හා ශිව දෙවියන්ගේ ආයුධ ද රැගෙන ලංකාවට ආ බලවත් රජකු ලෙස ගජබාහු රජු හඳුන්වා දී ඇත (රා.ව.සූරවීර.ඒ.වී.1997:94). මෙයින් එම රජු බොහෝ බලසම්පන්න රජකු බව හඳුන්වා දී තිබේ.

ගජබා රජුගෙන් පසු ලක්දිව සිහසුනට පත්වූයේ ඔහුගේ පුත්‍රයකු නොවේ. එයින් රාජ්‍යයත්වයේ නියම උරුම පිළිවෙළ ද බිඳී ගියේය. ඒ වෙනුවට රජ වූයේ සිය මාමා ය. හෙවත් බිරිඳගේ පියා ය. නමින් ඔහු මහල්ලක නාග ය. මහල්ලක යන පාලි වචනයේ තේරුම

වන්නේ මහලු, මහල්ලා යන අර්ථයයි (පා.සි.අ.,1998:336). සංස්කෘත භාෂාවේ මහල්ලක යන වදනින් මහලු, දුබල, අන්තඃපුර නපුන්සකයා යන අර්ථ සියල්ලම ගම්‍ය වේ (සං.සි.ශ,කෝ.2004:620). කෙසේ වෙතත් මහල්ලක වදනින් මහලු මෙන්ම ජ්‍යෙෂ්ඨයා යන අදහස ද ගත හැකි වේ. මහලු විජයබා යනු නිදසුනකි. එයින් විජයබාහු රජු මහලු යන අර්ථය නොම ගැන්වේ. ඒ වෙනුවට ජ්‍යෙෂ්ඨ විජයබාහු යන අර්ථය ලැබේ. එසේ ගතහොත් මහල්ලක යන වදනින් පෙනෙන්නේ ජ්‍යෙෂ්ඨ යන අදහසයි. මෙම රජුගේ මහල්ලක යන වදන සහිත ශිලා ලේඛනයක් මෑත කාලයේ හමු වී තිබේ (විමලබන්ති හිමි.ජී.2021:). එය එම රජුගේ නාමයෙන් ම සටහන් වූ එකම ශිලා ලේඛනය ද වේ. කෙසේ වෙතත් පරණවිතාණ මහල්ලක නාග යනු හබැස්ස ලිපියේ එන උපරාජ නාග බව කියයි. තව ද රුහුණේ රජ කළ උත්තර මහ රජුගේ දුවක ගජබාහු සරණ කර ගත් බව ද කියයි. එහෙත් නක රජු හෙවත් නාග යන වදන තිබූ පලියටම මහල්ලකනාග වශයෙන් හඳුනාගත හැකි නොවේ. උක්ත කයිලෑව ලිපියේ පමණක් "මහලනක රජ" වශයෙන් එම රජුගේ නාමය වංශකථාවේ තිබෙන ආකාරයටම සටහන් වී තිබේ. මේ නිසා පරණවිතාණ දැක්වූ අදහස් හෙවත් "උත්තර මහ රජුගේ පුත් නාග" වශයෙන් දැක්වීම මේ නිසා නැවතත් විවාදාපන්න වන බව පසක් වේ. එතුමාට මෙම ශිලාලේඛනය හමු වී තිබිණි නම් මෙම තොරතුරු තවදුරටත් වෙනස් වීමට ඉඩ තිබිණ. මේ නිසා මහල්ලක යනු මහලු යන අර්ථයෙන් ම නොව ජ්‍යෙෂ්ඨ යන අර්ථයෙන් ද ව්‍යවහාර කරන්නට ඇති බව සිතිය හැකිය.

මහල්ලක නාග රජු පිළිබඳව වංශකථාවන්හි සටහන්ව ඇත්තේ දකුණින් හා රට අභ්‍යන්තරයෙන් ද කළ විහාරාරාම පිළිබඳව පමණි. ආර්ථික තත්ත්වය උද්දීපනය සඳහා කළ වැව් හා අනෙකුත් ව්‍යාපාර පිළිබඳව වෙනත් විස්තරයක් වංශකථාවන්හි ම (මහාවංසය, දීපවංසය) අන්තර්ගත නොවේ. රාජාවලියෙහි ද එම රජු පිළිබඳව කිසිවක් සටහන් නොවේ. එහෙත් එම රජුගේ රාජ්‍ය කාලයෙහි රට අභ්‍යන්තරයෙහි කැරලි කෝලහාල හෝ විදේශ ආක්‍රමණයන් පිළිබඳ ද කිසිදු වාර්තාවක් නොලැබේ. ඒ නිසා රටේ සාමය සෞභාග්‍යය හොඳින් රඳා පැවැත්තේය. කෙසේ වෙතත් වංසකථාවන්හි නොසඳහන් තවත් වැව් ආදිය පිළිබඳ විස්තර ගජබාහු හා මහල්ලක නාග රජුගේ කාලවලට අයත් ශිලාලේඛනවලින් තහවුරු වේ.

මහල්ලකනාග රජුගේ අභාවයෙන් ඔහු දෙටුපුත් භාතිකතිස්ස රජු රාජ්‍යත්වයට පත් විය. ඔහු විසින් මෙරට ආර්ථික තත්ත්වය නගාසිටුවීම සඳහා කළ ක්‍රියාවන් අතර මහා ගාමණික නම් වැව කරවීමත්, රක්‍ඛ බණ්ඩක නම් තඩාගය කැණවීමත් ප්‍රධාන වේ. මේ පිළිබඳව දීපවංශය හා මහාවංශය සාමාන්‍යයෙන් එක් ආකාරයක් ගත් තොරතුරු වාර්තා කරයි (දී.ව.22:20, ම.ව.36:04). එහෙත් මහාවංශයේ පමණක් ඇති තොරතුරක් ලෙස වන්නි රට එක් වැව් නම් වූ වැව ඉදිකිරීම පෙන්වාදිය හැකිය. එහෙත් ශිලාලේඛනවලින් මීට වඩා වැඩි තොරතුරු ප්‍රමාණයක් මෙම රජු පිළිබඳව සටහන් වී තිබේ.

භාතිකතිස්ස රජුගේ අභාවයෙන් පසු රජ වූයේ ඔහු මලණුවන් වූ කණිට්ඨතිස්ස රජතුමා ය. එම රජු කළ කටයුතු පිළිබඳව ද ආගමික වශයෙන් වෙහෙර විහාරස්ථාන ඉදිරි කිරීමට කළ කාර්යවලට අමතර යමක් වංශකථාවන්හි සඳහන් නො වේ. එහෙත් භාතිකතිස්ස, කණිට්ඨතිස්ස යන රජුන් දෙපළම රටෙහි සෞභාග්‍යය පවත්වා ගනිමින් සතුරු වියවුල් හා කලකෝලාහලවලින් තොරව රාජ්‍ය ගෙන ගිය බව වාර්තා ගත සාධකවලින් තහවුරු වේ. එසේම දීපවංශයෙහි මෙම රජවරුන් දෙදෙනා රජකළ රාජ්‍ය කාලය පිළිබඳව දක්වන තොරතුරුවල ව්‍යාකූල තත්ත්වයක් පවතී. දීපවංශයට අනුව භාතිකතිස්ස රජු වසර විසිහතරක් රජ කළ බව කියයි (දී.ව.22.22). කණිට්ඨතිස්ස රජු වසර විසි අටක් රජ කළ බව කියයි (එම.25). එහෙත් වංශකථාගත සාධක තුලනය කිරීමේදී පැහැදිලි වන්නේ කණිට්ඨතිස්ස රජු රාජ්‍ය විචාරා ඇත්තේ වසර දහනමයක් පමණි (ලං.වි.වි.ල.ඉ.1972:305). ඒ අනුව දීපවංශ විස්තරයේ වර්ෂ ප්‍රමාණයේ යම් ව්‍යාකූලතාවයක් දර්ශනය වේ. එහෙත් පූජාවලියෙහි කණිට්ඨතිස්ස රජු එක් වසරක් පමණක් රාජ්‍යය විචාළ බව දැක්වේ (පූ.ව.2017:775). කෙසේ වෙතත් වසර පණහකට ආසන්න වූ (48) කාලයක් හෙවත් මහල්ලකනාග රජුගේ පටන් කණිට්ඨතිස්ස රජු දක්වා රාජ්‍ය කාලය රටෙහි සාමය ස්ථාපිත වූ ආගමික හා සමාජීය වශයෙන් පිළිගත හැකි මෙහෙවරක් සිදු වූ අඩසියවසක් වශයෙන් හඳුනාගත හැකිය.

කණිට්ඨතිස්ස රජුගේ අභාවයෙන් පසු මෙරට රජ වූයේ ඔහු දෙටුපුත් ඛුජ්ජනාග ය (ක්‍රි.ව.186-187). ඔහුට රජකම් කිරීමට අවකාශ ලැබුනේ එක් වසරක් පමණි. කණිටු සොහොයුරා වූ කුංචනාග ඔහු

මරා රජ ව වසර දෙකක් රාජ්‍ය කරවී ය (ක්‍රි.ව.187-189). එහෙත් මහාවංශයෙහි දැක්වෙන්නේ එක් වර්ෂයක් පමණක් රජ කළ බවයි. කෙසේ වෙතත් වෙහෙර විහාර ඉදි කිරීම් ආදිය හැර වෙනස් විස්තරයක් මෙම දෙරජුන්ගේ රාජ්‍ය කාලය ඇතුළත සනිටුහන් නොවේ. මේ තුළින් මෙතෙක් ලම්බකර්ණයන් යටතේ පැවති සාමය හා සමෘද්ධිය ට මෙම රජවරු බල ලෝභයෙන් ක්‍රියා කිරීම යම් බාධාවක් ගෙනදුන් කරුණක් වූ බව පෙනේ.

මහාවංශයෙහි දක්නට ලැබෙන පරිදි අනතුරුව රජ බවට පත් වන්නේ බුජ්ජනාගගේ බිසවගේ සොහොයුරු සිරිනාග යි. ඔහු කුංචනාග රජුගේ සේනාධිපති ධූරය දැරීය. එම සෙන්පති කුංචනාග රජු පළවා හැර සිරිනාග යන නමින් ලංකා රාජ්‍යයෙහි රාජ්‍යත්වයට පත් විය. එම රජ වර්ෂ දහනමයක් (ක්‍රි.ව.189-209) ලක් රාජ්‍ය විචාළ බව පෙනේ. සිරිනාග රජු (පළමු සිරිනාග) කළ කටයුතු අතර වංශකථාවේ දැක්වෙන්නේ ආගමික කටයුතු පමණි. රටෙහි ආර්ථික තත්ත්වය තවදුරටත් දියුණු කර ගැනීම උදෙසා කළ ව්‍යාපාර ආදිය සඳහන් නොවේ. එහෙත් රජු කුලම්බක නම් වූ බද්ද ඉවත් කළ බව දක්වා තිබේ (ම.ව.31:21). මෙහි කුලම්බක නම්වූ බද්ද යනු කුමක්දැ යි ශිලාලේඛන ආශ්‍රයෙන් හෝ වංශකථා ආශ්‍රයෙන් හෝ මෙම යුගයට අදාළව කරුණු හමු නොවේ. එහෙත් කුල අමණ වශයෙන් බද්දක් පිළිබඳව සඳහනක් මහාදාඨික මහානාග රජුගේ මිහින්තලා ගිරි ලිපියෙහි සඳහන්ව තිබේ (Paranavitana S. 1983:33). මේ පිළිබඳව සඳහන් කරන පරණවිතාන කුල අමණ යනු කුලම්බන නම් බද්ද විය හැකි බවත් ඒ පිළිබඳව පළමු වතාවට පළමු සිරිනාග රජුගේ මිහින්තලා ගිරි ලිපියෙහි සටහන්ව ඇති බවත් දක්වයි. ඒ එම ලිපිය පිළිබඳ විචාරයේදී පාදක සටහනක් මගිනි (ibid:34). තවදුරටත් පරණවිතාන දක්වන්නේ සෑම කුල්‍යකින්ම අමුණක බද්දක් අයකළ බවත් එම බද්ද කුල අමණ වශයෙන් මෙහි යෙදී ඇති බවත් ය (Paranavitana S. 2001:332). මි බද්දම හබරණ ගිරි ලිපියෙහි ද යෙදී තිබේ. එහි ''දකපතිය කුල අමන දෙකන කොටු සගසරහි ලියවය බොජියපතිය '' වශයෙන් සටහන් වී තිබේ (ibid:160). මෙහි කුල්‍ය යනු මැණීම් උපකරණයක් වන අතර එයට අල්ලනු ලබන ධාන්‍ය ප්‍රමාණය කුල්‍ය යන වදනින් අර්ථවත් වේ.

මෙහිදී පැන නගින ගැටලුව වන්නේ ක්‍රිස්තු වර්ෂ හැටහතේදී ආරම්භ වූ ලම්බකරණ රාජ වංශය කුංචනාග රජුගෙන් අවසන් වූයේ ද යන්නයි. ඒ කුංචනාග රජුගේ පුතෙක් අනුප්‍රාප්තිකයා වශයෙන් රාජ්‍යය පද ප්‍රාප්තියට පත් නොවීම නිසාය. මෙම තත්ත්වය විසඳාගැනීමට වංශකථාවලින් කිසිදු පිළිසරණක් නොලැබේ. වංශකථාවේ දක්වා ඇත්තේ සිරිනාග රජු කුජ්ජනාගගේ බිසවගේ සොහොයුරු සිරිනාග වශයෙනි (ම.ව.36:22/23). පූජාවලියේ දැක්වෙන ආකාරයට කුංචනාගගේ බෑණනුවන් වූ සිරිනාග වසර දහසයක් රාජ්‍ය විචාරා තිබේ (පූ.ව.2019:755). එහෙත් රාජවංශය බිඳී යාමට ඇති ඉඩකඩ ඉන් ඇහිරේ. පරණවිතානගේ මතය වන්නේ පළමු ලම්බකර්ණ රාජ වංශය කැඩී යාමක් ගැන සංඛා මතුවනු පෙනුණ ද ලක්දිව හමු වී ඇති ශිලාලේඛන පරීක්ෂා කිරීමේදී එසේ කැඩීයාමක් නොවූ බවට විශ්වාසය පළ කළ හැකි බවයි. ඉහත දක්වන ලද මහාවංස පුජාවලී වාර්තාකරණය ද එකකට එකක් නොගැලපේ. මෙහිදී මෙම ගැටලුව නිරවුල් කරගැනීමට සමත් ශිලාලේඛනයක් පරණවිතාණයෝ ඉස්සරසමණ විහාරයෙන් පෙන්වා දෙත්. එම ශිලා ලෙඛනයෙහි තිස්ස නම් මහරජ කෙනකුගේ පුත්‍රයෙක් වශයෙන් (පළමු) සිරිනාග හඳුන්වා දෙයි. "තිස මහරජ පුත සිරිනක මහරජහ" වශයෙන් එහි දක්වා තිබේ (EZ.Vol.IV.2041:217-222). නැවතත් එම ශිලා ලිපියෙහි "තිස මහරජ පුත සිරිනක මහරජ පුත තිස මහරජ" වශයෙන් දක්වා තිබේ. ඒ අනුව පරණවිතාණ පෙන්වා දෙනුයේ සිරිනාග රජ භාතිකතිස්ස රජුගේ පුත්‍රයකු වූ බවයි (ලං.වි.වි.ල.ඉ.1964:131). රණවීර ගුණවර්ධන ද මෙම මතය පිළිගත් බව පෙනේ. පරණවිතාන මෙම මතය වැඩිදුරටත් විස්තර කරමින් සිරිනාග රජු භාතිකතිස්ස රජුගේ පුත්‍රයකු වූ බවත්, කුංචනාග රජුගේ නෑ සොහොයුරකු වූ බවත් කියයි. මේ අනුව බලතහොත් පූජාවලියේ සඳහන් වන ආකාරයට සිරිනාග රජු කුංචනාග රජුගේ බෑනා කෙනෙක් බව පැවසීම උක්ත ශිලා ලේඛනයේ සඳහන් තොරතුරු හා ගැලපීමක් තිබෙන බව පෙනෙයි. මූර්ධජ "ණ" කාරය සහිතව "බෑණා" ලෙසින් ගත් විට එය සහෝදරයා යන තේරුම ලැබෙන බව පරණවිතාන පෙන්වා දෙයි (ලං.වි.වි.ල.ඉ.1964:131). ඒ අනුව බලන විට වසභ රාජෝ‍යාදයෙන් ආරම්භ වූ ලම්බකර්ණ රාජ වංශයේ බිඳී යාමක් නොපෙනෙන බව පැහැදිලි වේ. කෙසේ වෙතත් සිරිනාග රජු තම රාජ්‍ය කාලය තුළ ආගමික හා සාමාජික කටයුතු ඉටු

කළ බවට වංශකථා වාර්තා සනාථ කරයි. ආර්ථික තත්ත්වය පිළිබඳව බැලීමේදී මෙම යුගයේදී සමාජීය ආර්ථික කටයුතු පවත්වාගෙන යාමත් ආගමික කටයුතු තවදුරටත් දියුණු කිරීමත් සිද්ධ ව තිබෙන බව පසක් වේ.

පළමු සිරිනාග රජුගෙන් පසු සිංහාසනප්‍රාප්ත වන්නේ වෝහාරතිස්ස රජතුමා ය (ක්‍රි.ව.209-231). ඒ සිරිනාග රජුගේ පුත්‍රයෙකි. සිරිලක වසර විසිදෙකක් එම රජු රාජ්‍ය විචාළ බව සඳහන් වේ. වෝහාරතිස්ස රජු බොහෝ ධාර්මිකය. ලක්දිව පුරා හිංසනයෙන් තොර දණ්ඩනීති පළමුවෙන් ක්‍රියාත්මක කරන ලද්දේ එම රජු විසිනි. මෙම රජතුමා ආගමෙහි දියුණුව වෙනුවෙන් කරන ලද කටයුතු රාශියකි. එම ක්‍රියා පිළිබඳව වංශකථාව අභිරුචියෙන් වර්ණනා කරයි. එහෙත් ඔහුගේ කණිෂ්ඨ සහෝදරයා අභයනාග කුමරු රාජ දේවිය හා අයථා සම්බන්ධයක් තිබූ බවත් ඒ නිසාම එම රජු දකුණු ඉන්දියාවට පලා ගොස් නැවත සේනාවක් රැගෙන විත් වෝහාරතිස්ස රජු මරා ලක් රාජ්‍යයෙහි අභිෂේක ප්‍රාප්ත වූ බවක් පෙනේ. වෝහාරතිස්ස රාජ්‍ය සමයෙහි රටෙහි බෙහෙවින් සාමය පැවතිණ. එම යුගයෙහි ආර්ථික දියුණුව ද සිදු වූ බවට සැක නැත. එහෙත් වංශකථාවේ සටහන්ව ඇත්තේ එම රජුගේ ධාර්මික ක්‍රියා හා කරන ලද ආගමික කටයුතු ආදිය පිළිබඳව පමණි.

ධාර්මික වෝහාරතිස්ස රජු මරා රාජ්‍ය පැහැර ගන්නා ලද්දේ ඔහු කණිටු සොහොයුරු අභයනාග විසිනි. ඔහු වසර අටක් රජකම් කළේය (ක්‍රි.ව.231-240). අභයනාග රජ වූ ආකාරය පිළිබඳව විචිත්‍ර කුමන්ත්‍රණ කථාවක් වංසකථාවේ ගෙනහැර දක්වා තිබේ. එහෙත් ඔහු දකුණු ඉන්දියාවට පලාගොස් සේනාවක් ගෙනවුත් ලක් සිංහාසනයෙහි රජ වූ බව එයින් ප්‍රකටව පෙනේ. එම රජුගේ වසර අටක කාලය ධාර්මිකව පාලනය ගෙන ගිය බව ද මහාවංශයෙහි සටහන් වේ (ම.ව.36:51).

අභයනාග රජු ඇවෑමෙන් රාජ්‍යත්වයට පත්වන්නේ ඔහුගේ පුත්‍රයකු නොවේ. වෝහාරතිස්ස රජුගේ පුත්‍ර සිරිනාග (II සිරිනාග) රජු වසර දෙකක් (ක්‍රි.ව.240-242) රාජ්‍ය විචාළ බවත්, එම කාලය තුළ මහා බෝධිය අසල කළ නවකම් හා ඉදිකිරීම් ආදිය පිළිබඳවත් මහාවංශයේ

ගෞරවයෙන් වාර්තා කරයි (ම.ව.36:55). ඊට අමතරව රටේ ආර්ථික තත්ත්වය පුනර්ජීවනය සඳහා කරන ලද කටයුතු පිළිබඳව කිසිවක් සඳහන් නො වේ.

දෙවන සිරිනාග රජු ඇවෑමෙන් එම රජුගේ පුත් විජය කුමරු (ක්‍රි.ව.242-243) එක් වර්ෂයක් රජකම් කරන ලද බව වංශ කථාවන්හි වාර්තා කෙරේ (ම.ව.36:57:දී.ව.22:49). මෙම කාල පරිච්ඡේදයෙහි ආගමික වශයෙන් කළ කරුණු සටහන් වනවා විනා ආර්ථික වර්ධනය කරගැනීම උදෙසා කළ කටයුතු කිසිවක් පිළිබඳව තොරතුරු වාර්තා නොවේ. එයින් සනාථ වන්නේ වංශකථාකරුවන් එම රජවරුන්ගේ කාලවල සිදු වූ ආගමික පුනර්ජීවනය පිළිබඳ තොරතුරු වාර්තා කිරීමට ප්‍රමුඛස්ථානයක් ලබාදී තිබූ බවයි. කෙසේ වෙතත් ලම්භකරණයන් ආර්ථිකය දියුණු කිරීමට හා නගාසිටුවීම උදෙසා කළ කටයුතු පිළිබඳ ශිලා ලේඛන ආශ්‍රිතව වැඩි තොරතුරු ප්‍රමාණයක් සටහන් වන බව දැක්විය හැකිය.

එතැන් සිට වංශකථාවෙහි දැක්වෙන්නේ යළිත් රාජ්‍ය පදවිය ලබා ගැනීමේ අනුපිළිවල ගිලිහී ගිය ආකාරය පිළිබඳ තොරතුරු සමූහයකි. විටෙක ලම්බකරණ රාජ වංශය විජයරාජ රජුගෙන් (විජයිඳු) කැඩී බිඳී ගියේදැ යි විමර්ශනය කිරීමට යෙදෙන කරුණු රාශියක් එතැන් සිට පෙළ ගැස් වේ. රජ පදවිය පිළිබඳ උරුමය විජයිඳු රජුගේ පුත්‍රයකුට පැවරීමක් සිදු වූ බවක් නොපෙනේ. ඒ වෙනුවට සංඝතිස්ස, සංඝබෝධි සහ ගෝඨාභය යන රාජ කුමාරවරු තිදෙනෙක් ක්‍රමයෙන් රාජ්‍යත්වයට පත්වන පුවතක් ඉන්පසු වාර්තා වේ. කෙසේ වෙතත් මහාවංසයෙහි (ම.ව.36:58) හා දීපවංසයෙහි (දී.ව.22:46) මෙම කුමාරවරුන් තිදෙනා ද ලම්භකර්ණ වංශිකයන් බව දක්වා තිබේ. එහෙත් ඔවුන් නියමාකාරයෙන් රාජ්‍යත්වය සඳහා උරුමයක් තිබූ අය ලෙස වාර්තාවලින් පැහැදිලි නොවේ. වංශකථාවන්හි සිරිත් පරිදි දක්නා ලැබෙන අනාගත වක්තෘන්ගේ සම්බන්ධයක් මෙම පුවතට ද ආරෝපණය කොට තිබේ. මේ තිදෙනාගේ නිත්‍ය වාසස්ථානය වූයේ මියුගුණ වෙහෙර සමීපයෙහි (මහියංගණය) වූ ප්‍රදේශයකි. ඔවුන් රාජෝපස්ථානය පිණිස එන අතරවාරයේ ඔවුන්ගේ අඩි ශබ්දය ඇසූ එක් අන්ධ අනාගතවක්තෘවරයෙක් ඔවුන් තිදෙනාම සිරිලක රජසිරි විඳින බව දක්වන ලදි (ම.ව.36:59-60). මේ නිමිත්තපාඨකයා සිටියේ

තිසාවැවේ ඒදඬු ගෘහයෙහි ය. කෙසේ වෙතත් එබඳු පුවත් වංශකථා වාර්තා කරනුයේ රාජ්‍ය පදප්‍රාප්තිය සඳහා මේ කුමාරවරුන්ට උරුමයක් තිබෙන බව පෙන්වීමටයි. එසේම අනුරාධපුරයේදී මේ රාජ කුමාරවරුන්ට විජයිඳු රජුගේ උසස් තනතුරු හිමි විය. තිදෙනා එක්ව රජු මරා දැමූ අතර පළමුවෙන් රාජ්‍යත්වයට පත්වන සංඝතිස්ස කුමරු ඒ වන විට සෙන්පති ධූරය දරමින් සිටීමෙන් ම ඒ බව තහවුරු වේ. මේ සම්බන්ධ කථා ප්‍රවෘත්තිය කියවන විට පැහැදිලි වන්නේ ඔවුන් ඉතාමත් උපක්‍රමශීලීව රටෙහි පාලන බලය අල්ලා ගැනීමට ක්‍රියා කළ බවයි. සංඝතිස්සස විජයිඳු මරා රාජ්‍යත්වයට පත් විය (ක්‍රි.ව.243-247). එම රජතුමා බොහෝ ආගමික කටයුතු හා උත්සව ද මහා ථූපයෙහි චත්‍ර ප්‍රදානය ද කළ බව වංශකථාවෙහි දක්වා තිබේ. කෙසේ වෙතත් දඹ කෑමට ලොල් වූ එම රජතුමා ජම්බුවලට විෂ යෙදීමෙන් ඒවා කා මියගිය බව වංශකථාවේ දැක්වේ. එම විෂ යොදන ලද්දේ නැගනහිර වැසි මිනිසුන් විසින් බවට වංශකථාව විස්තර කොට තිබේ. ඉන් අනතුරුව ගෝඨාභය කුමරු රාජ්‍යයට පත්කර ගන්නා ලදි. මෙයින් සිරි සංඝබෝධි රජතුමා ඉතා ධාර්මිකයෙක් මෙන්ම පිනට දහමට ඉතා ළැදි රජ කෙනෙක් වශයෙන් ද වංශකථාව හඳුන්වා දෙයි. කෙසේ වෙතත් අභිනවයෙන් ලක්දිව එම රජවරු තිදෙනාගෙන් වැඩි කාලයක් රාජ්‍ය විචාරනු ලබන්නේ කවුරුන්දැ යි විමසීම සිදුකරන ලද්දේ ගෝඨාභය කුමරු විසිනි. අන් දෙදෙනාට නොදැනෙන්නට දැනගත් මේ ප්‍රවෘත්තිය අනුව ඔහු ම අසහාය රජු වශයෙන් පත්වන බව ස්ථාවර විය. මෙම තත්ත්වය යටතේ සිය රාජපදප්‍රාප්තිය වෙනුවෙන් ක්‍රමානුකූලව සෙසු රජවරු උපක්‍රමශීලීව මරා දැමීමට ඔහු කියා ක්‍රියා කළේ ද යනු එළඹිය හැකි පැහැදිලි නිගමනයකි. කෙසේ වෙතත් සංඝබෝධි රජුගේ භාණ්ඩාගාරික ධූරය දරන ලද්දේ ගෝඨාභය විසිනි.

සංඝබෝධි රජු රජවූවායින් පසු වසර දෙකක් (ක්‍රි.ව.247-249) රාජ්‍ය විචාරන ලදි. මහාවංශයෙහි මෙම රජුගේ ධර්මිකත්වය පෙන්වීම සඳහා වැඩි ඉඩක් වෙන් කර ඇති බව පෙනේ. රජු ජීවිත පරිත්‍යාග යෙන් ක්‍රියා කොට නියං බියෙන් ජනයා මිදවීම, රක්තාක්ෂි භය දුරලීම, සොරුන් හෝ මං පහරන්නන්හට ජීවිත දානය දී යහපත් පුරවැසියන් බවට පත් කරලීම වැනි ධාර්මික වැඩ ද ආගමික වශයෙන් මහාවිහාරයට ලහබත් ගෙයක් කරවීම වැනි කටයුතු ද ශීල සමාදානය ආදී උතුම් ක්‍රියා ද එම විස්තරය තුළ ඇතුළත් වේ. කෙසේ වෙතත්

මෙම රජුගේ රාජ්‍ය වර්ෂ දෙක (ක්‍රි.ව. 247-249) ඉතාමත් ධාර්මික වූවක් බව මහාවංශයෙහි දක්වා තිබේ. මෙම රජුගේ ධාර්මිකත්වය කෙතරම්ද යත් පසුකාලීනව රාජ්‍යය විචාළ රජවරු "සිරිසඟබෝ" යන අභිධානය තමන්ගේ නාමය ලෙස භාවිත කිරීමෙන් ද ඒ බව තහවුරු වේ. රජුගේ ශීර්ෂ දානය කළ හත්ථවනගල්ල විහාරවංසයේ සඳහන් අත්තනගල්ල විහාරය හත්ථිකුච්ඡි විහාරය බව එහි ඇති ශිලා ලේඛන හා වෙනත් සාධක මගින් තහවුරු වී ඇත්තේය. (විමලබන්ති හිමි. ජී., ලගමුව අරිය. 2017) කෙසේ වෙතත් රාජ්‍යත්වය වර්ෂ දෙකක් ඉකුත් වීමෙන් පසු රාජ්‍යය පැහැර ගැනීමට රජුගේ භාණ්ඩාගාරික ධූරය දරමින් ක්‍රියා කළ ගෝඨාභය කුමරු ක්‍රියා කළ බව ද පරපණ නැසීමට අකමැති වූ රජු සිය රාජ්‍යයය හා ඊට අයත් සියල්ල හැරදමා වනගත වූ බව ද මෙහි වාර්තාකොට තිබේ. කෙසේ වෙතත් රාජ්‍ය බලය ලබා ගැනීමේ නොතිත් ආශාවෙන් සැලසුම් සහගතව ක්‍රියා කළ ගෝඨාභය කැරැල්ලක් මාර්ගයෙන් රාජ්‍ය බලය ලබා ගත් බව මෙයින් තහවුරු වේ. සිරි සංඝබෝධි රජු ගේ රාජ්‍ය කාලය පිළිබඳ දීපවංශ විස්තරයෙහි රජු කළ ලහබත් ගෙය පිළිබඳව පමණක් සටහන් වේ. ඊට වඩා වැඩි විස්තරයක් ඒ තුළ අඩංගු නොවේ (දී.ව.22:51:32). සංඝතිස්ස, සංඝබෝධි හා ගෝඨාභය යන රජවරුන් තිදෙනා අතුරින් ගෝඨාභය රාජ්‍ය බලය ලබා ගැනීමේ අදිටනින් සිය සොහොයුරන් දෙදෙනාම උපක්‍රමිකව මරා දමන ලද බවත්, ඉතා සැලසුම් සහගත ලෙස තම රාජ්‍යත්වය  තහවුරු කරගන්නා බවත් එම තොරතුරුවලින් සනාථ වේ. එහෙත් සිරි සංඝබෝධි රාජ චරිතය මෙරට රජවරුන් අතර ඉතා ගෞරවාන්විත රාජ චරිතයක් වශයෙන් වඩා වර්ධනය වනු එතැන් සිට රජ කළ ඇතැම් රජවරුන් එය සිය නාමය බවට පත්කර ගැනීමෙන් තහවුරු වේ. කාලය වශයෙන් ගත් කළ හත්වැනි සියවසේ සිට දොළොස් වැනි සියවස දක්වා රාජ්‍යත්වයට පත් රජවරු මාරුවෙන් මාරුවට මෙම නාමය භාවිත කළහ. එසේම දහතුන් වැනි සියවයේ සිට දහසය වැනි සියවස දක්වා රජවරු ද මෙම නාමය තම අභිෂේක නාමය වශයෙන් භාවිත කළ බව ප්‍රකට වේ. පරණවිතාන දක්වන්නේ සිරි සංඝබෝධි රජු බෝධිසත්වයකු වශයෙන් බුද්ධත්වය ප්‍රාර්ථනා කළ බැවින් මහායාන දර්ශනයේ ඉගැන්වීම් උලුප්පා පෙන්නුම් කළ මෙම යුගයේ  එම මහායාන දර්ශනයේ දාර්ශනික කොටස් මෙලෙස ලක්දිව ප්‍රචලිත වීමේ අවස්ථාවක් වශයෙන් ද මෙය හඳුන්වා දිය හැකි

බවයි (ලං.වි.වි.ල.ඉ.185). කෙසේ වෙතත් සිරි සංඝබෝධි රජුගේ ශරීරය ආදාහනය කළ ස්ථානය ඉසුරුමුණි විහාරයෙන් දක්ෂිණ දිසා භාගයේ පිහිටි බව වංසත්ථප්පකාසිනියෙහි දැක්වෙයි (ව.ප.2001:443). එය එම විහාරස්ථානය කුමක්ද යන්නට ඇති ගැටලු විමර්ශනය කොට විසඳා ගැනීමට වැදගත් සාධකයක් ලෙස පෙනේ.

ගෝඨාභය රජු මේඝවර්ණාභය නමින් පෙනී සිටිමින් වසර දහතුනක් (13) (ක්‍රි.ව.249-262) මෙරට රාජ්‍ය විචාරා තිබේ. එම කාලය තුළ ආගමික වශයෙන් වෙහෙර විහාර ඉදි කිරීම, මහදන් පැවැත්වීම, චීවර දාන, උත්සව සංවිධානය ආදී භික්ෂූන්ගේ සිත් ගන්නා විවිධ ආගමික ක්‍රියාකාරකම්හි නිරත වූ බව මහාවංසය වාර්තා කරයි (ම.ව.93:100). එහෙත් අභයගිරිවාසී වෛතුල්‍යවාදීන් මර්දනය පිණිස එය වැළඳගත් සැටනමක් වෙර ලකුණු ඔබ්බවා රටින් පිටුවහල් කිරීමට ක්‍රියා කළේය. ගෝඨාභය රජු කිපෙනසුළු, වහා තීන්දු තීරණ ක්‍රියාවේ යොදවන අයකු වශයෙන් ද මහාවංශයේ පෙණෙන තොරතුරු ආශ්‍රයෙන් හඳුනාගත හැකිවේ. මෙලෙස වෛතුල්‍යවාදීන් රටින් නෙරපීම මහාවිහාරයේ විනාශය සඳහා ද හේතුකාරක වූ බව පෙනේ. එහෙත් ගෝඨාභය රජුගේ රාජ්‍ය පාලනය ආගමික වශයෙන් මහා විහාරික භික්ෂූන්ගේ ජයග්‍රාහි කාල පරිච්ඡේදයක් ලෙස ද ප්‍රකට ය.

ගෝඨාභය රජුගේ පරම්පරාව වංශකථාහි අවිනිශ්චිතය. ලම්භකර්ණ බව කිව්ව ද ඊට එහා ගිය විස්තරයක් ඒවාහි සටහන් නොවේ. එම හිඩැස පුරවා ගැනීමට ශිලා ලේඛන සාක්ෂි භාවිත කළ හැකිය. තිඹිරිවැව පර්වත ලිපියට අනුව සිරිනක (සිරිනාග) නම් රජ කෙනෙකු ගේ පුත්‍රයකු වූ "මෙකවන අබ" හෙවත් මේඝවර්ණාභය නම් රජ කෙනෙක් ගැන කියවෙයි. මේඝවර්ණ අභය නමින් නම් ඇති නරපතියන් දෙදෙනෙක් මෙරට රාජ්‍ය විචාරා තිබේ. ඒ මේඝවර්ණාභය (ගෝඨාභය) (ක්‍රි.ව.249-262) සිරි මේඝවර්ණ (කිත්සිරිමෙවන්) (ක්‍රි.ව.301-328) යනු එම රජුන් දෙදෙනා වේ. මේ ශිලා ලිපියේ දක්නට ලැබෙන්නේ සිරිනාග නම් රජ කෙනෙකුගේ පුත්‍රයෙකු වූ "මෙකවන අබ" කෙනෙකි (EZ.Vol.IV.224,,ල.වි.වි.ලං.ඉ.(136). එහෙත් දෙවැනියට කී සිරි මේඝවර්ණ රජු සිරිනාග නම් රජ කෙනෙකු ගේ පුත්‍රයෙක් නොවේ. මහාසේන මහරජුගේ පුත්‍රයෙකි (EZ.Vol.IV.224-225). ඒ නයින් බලන කල ඉතා පැහැදිලිව සිරි

මේසවර්ණාභයට තිඹිරිවැව පර්වත ලිපිය අයත් කිරීම සදොස් බව ප්‍රකට වේ. එහෙත් "සිරිනක" වශයෙන් සඳහන් වන සිරිනාග රජවරුන් ඉතිහාසයෙහි දෙදෙනෙක් පිළිබඳව සටහන් වෙයි. එනම් පළමු සිරිනාග වශයෙන් හඳුන්වනු ලබන භාතික තිස්ස රජුගේ පුත් වූ සිරි නාග (ක්‍රි.ව.189-209) හා දෙවන සිරිනාග වශයෙන් හඳුන්වනු ලබන වෝහාරිකතිස්ස රජුගේ පුත්‍ර සිරිනාග (ක්‍රි.ව.240-242) යන දෙදෙනා යි. මෙයින් මෙම ශිලා ලිපියේ සඳහන් සිරිනක පළමු සිරිනාග වශයෙන් හඳුනාගනු ලැබුවහොත් එම රජු ගෝඨාභය රජු රජ වීමට වසර තිස් නමයකට කලින් එම රජු මරණයට පත් වූ හෙයින් එය පිළිගැනීමට බෙහෙවින් අසීරු වේ (ලං.වි.වි.ල.ඉ.186). එහෙත් දෙවැනි සිරිනාග රජු 'සිරිනක' වශයෙන් හඳුනාගත් විට එම රජුගේ පුත්‍රයා "මෙකවණ අබ" වශයෙන් හඳුනා ගැනීමට බාධාවක් නොවේ. මෙම තත්ත්වය යටතේ ගෝඨාභය රජු දෙවන සිරිනාග රජුගේ පුත්‍රයකු වශයෙන් හඳුනාගත හැකිය. එපවත් විමර්ශනය කරන විට පෙනී යන්නේ සංඝතිස්ස රජු රජ වීමෙන් පළමු ලම්බකර්ණ රාජ වංශය බිඳී ගිය බවක් හැඟෙන නමුදු එය එසේ සිදුව නොමැති බව උක්ත ශිලාලේඛනයෙන් පසක් වන බවයි. කෙසේ වෙතත් ගෝඨාභය රජු රාජ බල ලෝභයෙන් ක්‍රියා කරමින් තම සොහොයුරන් දෙදෙනාත් උපක්‍රමශීලීව මරා දමා රාජ්‍යත්වයට පත් වූවෙකු වශයෙන් සැලකිය හැකි වුව ද ඔහුගේ රාජ්‍ය පාලන යුගයේදී රටෙහි සාමය හා සමෘද්ධිය ඉතා හොඳින් පැවති කාල වකවානුවක් වශයෙන් ද හඳුනාගත හැකි ය.

ගෝඨාභය රජුගෙන් පසු රාජ්‍යත්වයට පත් වන්නේ ඔහු දෙටුපුත් ජෙට්ඨතිස්ස ය (ක්‍රි.ව.263-273). එම රජු දරුණු රජ කෙනෙකු වශයෙන් ද හැඳින් වේ. වෛතුල්‍යවාදය ගත් නිසා මෙරටින් නෙරපා හරින ලද අභයගිරිවාසී භික්ෂූන්ගේ වෙර ලකුණු බලා වෛතුල්‍යවාදය ගත් සංඝමිත්‍ර නම් භික්ෂුවක් ගෝඨාභය රජුගේ සිත් ගෙන තම පුතුන් දෙදෙනාට ශාස්ත්‍ර දානය සඳහා භාරදී ඇති බව මහාවංශයෙහි සටහන් වේ (ම.ව.36:117). මෙහිදී එම භික්ෂුවට මහසෙන් රජුගේ සිත දිනා ගත හැකි වුව ද ජ්‍යෙෂ්ඨ කුමාරයා වූ ජෙට්ඨතිස්සගේ සිත දිනා ගැනීමට නොහැකි විය. මෙයින් ද පැහැදිළි වන්නේ ජෙට්ඨතිස්ස දැඩි තීරණ ගත් රජකු බවයි. සිය පිය රජු ගේ ආදාහන පෙරහරේදී තමාගේ රාජ පදප්‍රාප්තියට අසන්තෝෂව සිටි අමාත්‍යවරු ආදාහන උත්සවයට සම්බන්ධ නොවූ නිසා ඔවුන් මරා රජුගේ චිතකය වටා උල සිඳුවාලූ

බව ද වංශකථාව වාර්තා කරයි (ම.ව.36:122,ලං.වි.වි.ල.ඉ.186). මේ නිසා ජෙට්ඨතිස්සගේ නාමයට මුලින් "කක්බල" යන උප පදය ද භාවිතයට පැමිණියේය. කෙසේ වෙතත් එම රජු ථූපාරාමයෙහි හා මහා සෑය ආදියෙහි ද ලෝවාමහාපාය නැවත සත්මහල් ප්‍රාසාදයක් දක්වා විශාල කිරීම ඇතුළු ආගමික කටයුතු රාශියක් කළ බව වංශකථා වාර්තා කරනු පෙනේ. තව ද එම රජු "ආලම්බගාම" නම් වැව ද කරවූ බව දක්වා තිබේ. මෙරට ආර්ථික තත්ත්වය වඩා වර්ධනය කිරීමේ කටයුත්තට ප්‍රධාන වශයෙන් ජෙට්ඨතිස්ස රජු සම්බන්ධ වූ බව මින් ප්‍රකට වේ. බොහෝ විට මෙම කාල පරිච්ඡේදයෙහි ආගමික වශයෙන් වූ අවුල් වියවුල් වාර්තා කිරීමට වාර්තාකරුවන්ට සාධක ඇති බැවින් ආර්ථික තත්ත්වය පිළිබඳ තොරතුරු වාර්තා කිරීම අතපසු වීමක් ද සිදු වන්නට ඇති සෙයක් පෙනේ. ඇතැම් රජවරු තම නමින් හෝ එම රජු යටතේ හෝ කළ වැව් ආදිය පිළිබඳ විස්තර බොහොමයක් වංශකථාවෙහි නොමැති වුව ද ශිලා ලේඛනවල අන්තර්ගතව තිබේ. ජෙට්ඨතිස්ස රජුගේ දස අවුරුදු රාජ්‍ය පාලනය ඔහුගේ මරණයෙන් පසු කෙළවර වූ අතර අනතුරුව මහසෙන් රජු රාජ්‍යත්වයට පත් විය.

මහාවංශයෙහි දක්වන ආකාරයට මහසෙන් රජුගේ රාජ්‍ය කාලය වර්ෂ විසිහතකි (ක්‍රි.ව.274-301). මහසෙන් රජු ප්‍රකට ව ඇත්තේ රටෙහි ආර්ථික පුනර්ජීවනය උදෙසා මහා වැව් ව්‍යාපාරය එහි හිණිපෙත්තටම ළඟා කළ රජ කෙනෙකු ලෙයසි. එහෙත් ආගමික වශයෙන් එම රජුගේ ක්‍රියාකලාපය මහා විහාරවාසීන්ගේ ප්‍රසාදයට හේතු නොවීය. මහාවංසයෙහි එම රජුගේ ක්‍රියාකලාපය පිළිබඳව වාර්තා කොට ඇත්තේ "ඉතා බොහෝ පින් හා පව් රැස් කළේය" යනුවෙනි (ම.ව.36:50). මහසෙන් රජු පිළිබඳව මහා විහාරිකයන්ගේ අප්‍රසාදය ඇති වූයේ එම විහාරය විනාශ කිරීම නිසාය.

ආගමික අංශයෙන් පරීක්ෂා කිරීමේදී මෙම රජුගේ රාජ්‍ය කාලය තුළ වළගම්බා රාජෝ්‍යාදයේ සිට මහා විහාරයට ප්‍රතිපක්ෂ මතයක් අභයගිරිය විහාර ආරාමය කේන්ද්‍ර කරගෙන ආරම්භ ව පැවති අතර එය ක්‍රමක්‍රමයෙන් වඩා වර්ධනය වී එහි උපරිම අවස්ථාවට ලං වූ යුගයක් වශයෙන් එම යුගය හඳුනා ගත හැකිය. විවිධ හැලහැප්පීම් මධ්‍යයේ මහාවිහාරවාසීන්ට රජුගේ රාජ්‍ය බලය භාවිත කරමින් නැගී සිටීමට හැකි වුව ද මෙම අවස්ථාවේදී එය පරාජයට පත්වීමක් නිරීක්ෂණය කළ හැකි ය.

බොහෝ සෙයින්ම මහා විහාරය, අභයගිරි, තරඟය යම් කඩඉමකට ගෙන ඒමට හැකි වූයේ සංඝමිත්‍ර නම් වෛතුල්‍යවාදය ගත් පාප භික්ෂුවකගේ ඉගැන්වීම් බස් නිසා බව මහාවංශය කියයි (ම.ව-37:04). කෙසේ වෙතත් මහා විහාරවාසී භික්ෂූන්ට දන් දීම රාජ නියෝගයෙන් තහනම් වේ. එවිට වර්ෂ නවයක් මහාවිහාරය හිස් වේ. එහි සිටි භික්ෂූහු මලය රටට හා රුහුණු රටට පලාගියහ. මෙතෙක් කල් විවිධ රජවරු ඉදිකළ මහ ඉහළින් මහාවංශයෙහි වර්ණනා කළ මහා විහාරය අස්වාමික වූ හෙයින් රජුට අයත් විය. එය බිඳ එහි වටිනා වස්තූන් ද විහාරාංග ද කඩා ගෙන ගොස් අභයගිරිය මහ ඉහළින් වර්ධනය කළ බව වංශකථාවේ සටහන් වේ. මේ තත්ත්වය මත මහා විහාරය වෙනුවෙන් රජුට ඉතා කුළුපගව සිටි මේඝවර්ණාභය නම් අමාත්‍යයා මගින් යුද්ධයක් මගින් මෙය විසඳාගැනීමට දෙපාර්ශවය කඳවුරු බැඳ ගත්ත ද දෙදෙනාගේ සුහදතාව මත එම සටන අතහැර දැමීමටත් මහා විහාරය නැවත ගොඩනැගීමටත් රජු කැමති විය. ඒ අනුව මහා විහාරය නැවත ගොඩනැගීම ද රජු සිදු කළ අතර සංඝමිත්‍ර භික්ෂුව හා එම භික්ෂුවට අනුබල දුන් 'සෝණ' නම් අමාත්‍යවරයා ද රජුගේ බිසවක විසින් මරා දමන ලදි. කෙසේ වෙතත් මද කලක් ඇවෑමෙන් නැවතත් මහාවිහාරිකයන්ගේ විරෝධය මධ්‍යයේ ම එහි සීමාව උල්ලංඝනය කොට මහසෙන් රජු විසින් ජේතවනාරාමය ඉදි කරන ලදි. මෙය අනුරාධපුර ඇතුළුනුවර තෙවන විශාල ආරාමය බවට ද පත් විය. මෙම තත්ත්වය මත රජු කෙසේ වෙතත් මහාවිහාරිකයන්ගේ මතයට කන් නොදී ක්‍රියා කිරීම දිගින් දිගට පවත්වාගෙන ආ බව මෙතුළින් පසක් වේ. දීපවංසයෙහි මෙම තොරතුරු මහාවංසයට බොහෝ විට සමාන අයුරින් ඉදිරිපත් කොට තිබේ (දී.ව.22:64-73).

අපගේ විමර්ශනයට බෙහෙවින් වැදගත් රටෙහි ආර්ථික තත්ත්වය දියුණු කරගැනීම උදෙසා මහ වැව් ව්‍යාපාර ආදිය ඇති කිරීමට ක්‍රියා කිරීම නිසා මහසෙන් රජු රටවැසියාගේ මහත් ගෞරවාදරයට ද පාත්‍ර විය. මහසෙන් දෙවියන් නොහොත් "හත් රජ්ජුරු බණ්ඩාර" යන නාමයෙන් එම රජු හඳුන්වනු ලැබේ. මහසෙන් රජු විසින් කරවන ලද වාරි ව්‍යාපාර අතර වැව් දහසයක නම් දැක්වේ. එනම් මින්නේරි වැව, විල්ලූරු වැව, බාහු නම් වැව, මාමිණියා වැව, කේකවාත වැව, මොනරා වැව, පරක වැව, කුම්බාලක වැව, වාහක

වැව, රත්මල්කඩ වැව, තිහව නම් වැව, වේලංවිටි වැව, මාගල් වැව, සිරු වැව, මහදාරගල්ලක වැව, කළුපහන් වැව, යන වැව් ද පර්වත නම් වූ ඇළක් ද වේ (ම.ව.36:47:50). රට සුභික්ෂ කිරීම සඳහා රජු මහත් උද්යෝගයෙන් මේ මහා වාරි ව්‍යාපාර ක්‍රියාත්මක කළ බව වංශ කථාවේ සටහන් කර තිබේ. මේ නිසා මහසෙන් මහ රජු මෙරට ආර්ථිකය උදෙසා එහි දියුණුවට අද්විතීය මෙහෙයක් ඉටු කළ බව සැලකිය හැකිය. මීට අමතරව වෙහෙර විහාර ඉදි කොට ඒවාට පහසුකම් සලසා දීම කෙරෙහි ද රජුගේ අවධානය බෙහෙවින් යොදන ලද බව පසක් වේ. මේ නිසා මහසෙන් රජු ලම්බකර්ණ රාජ වංශය සෝභමාන කළ රජ කෙනෙකු වශයෙන් ඉතිහාසයේ හැඳින්වේ.

මහසෙන් රජුගේ අභාවයෙන් පසුව එම රජුගේ දෙටුපුත් කිත්සිරිමේඝ හෙවත් කිත්සිරිමෙවන් රජ බවට පත් විය (ක්‍රි.ව.301-328). මහාවංශයෙහි මහසෙන් රජුගේ රාජ්‍ය කාලයට සම්පූර්ණ පරිච්ඡේදයක් ම වෙන් කොට තිබේ. එසේම මහාවංශය ද දීපවංශය ද එයින් අවසන් විය. මහා වංශයෙහි දෙවන භාගයට අයත් පළමු රජු ලෙස ගැනෙන්නේ කිත්සිරිමේඝ රජු ය. එම රජු පැහැදිලිවම ලම්බකර්ණ රාජ වංශය නියෝජනය කරන බැවින් රාජවංශයේ බිඳීමක් සිදුව නොමැත්තේය. කිත්සිරිමෙවන් රජු යළිත් මහාවිහාර අභයගිරි ගැටුමට සම්බන්ධතාවයක් දක්වයි. එහෙත් මෙම රජු එම ගැටලුව සිය අභිමතය පරිදි විසඳාලීමට ඉදිරිපත් නොවී බුද්ධිමත් පියවරක් වෙත අවතීර්ණ වූ බව පෙනේ. ඒ අනුව මහා විහාරයට පිය රජු විසින් කළ හානිය එම ආරාම වැසි භික්ෂූන්ගෙන් විමසා ඒ සියල්ල යථාවත් කිරීමට ක්‍රියා කළේය. යළිදු මේ රටට බුදුසමය ගෙන ආ මිහිඳු මහ තෙරුන් ගේ පිළිරුවක් සාදා එයට පුද සිරිත් පැවැත්වීම ද මහ පෙරහරින් වැඩම වීම ද ආරම්භ කරන ලදි. දළදා වහන්සේ ද වැඩම වනු ලබන්නේ මෙම රජුගේ රාජ්‍ය කාලයේ ය. මේ සඳහා ද දාඨාධාතු මන්දිරයක් සාදා පෙරහැර පැවැත්වීමට ද ක්‍රියා කරන ලද්දේ ද මේ වකවානුවේ සිටයි. මෙලෙස ආගමික වශයෙන් මහාවිහාරවංශිකයන් සතුටු කිරීමට සමත් ක්‍රියාදාම රාශියක් කළ රජතෙම පිය රජු කළ හානි වූ සියලු ආරාම ද යළි ප්‍රතිසංස්කරණය කළේ ය. එහෙත් රජතෙම අභයගිරි විහාරයට අනුග්‍රහ දැක්වීම ද නැවැත් වූ බවට සාධක නොවේ. දන්ත ධාතුන් වහන්සේගේ භාරකාරත්වය හා පුද පෙරහැර පැවැත්වීම ද භාර වූයේ අභයගිරියටම වේ. කෙසේ වෙතත් මහාවිහාරිකයින්

නවක්‍රම හෝ නව්‍යමතවාද විෂයෙහි අනුකූලතාවයක් නොදක්වනු ලබන හෙයින් පහසුවෙන් ඒ සඳහා අභයගිරි වාසීන්ට අයිතිවාසිකම් කීමට අවකාශ හිමි වන්නට ඇත. මේ බව රණවීර ගුණවර්ධන ද අනුමත කොට තිබේ (ගුණවර්ධන ආර්.1987:77). මෙම රජුගේ රාජ්‍ය කාලයට අයත් ප්‍රකට තෝනිගල ගරිලිපිය ද ඉතා වැදගත් එකකි. මෙම ශිලා ලිපියේ පැහැදිලිවම "පුවිය මහසෙන මහරජ පුත සිරිමෙකවන අබ මහරජහ" වශයෙන් එම රජ හඳුන්වාදී තිබේ. එයින් මහසෙන් රජුගේ පුත්‍රයා බව ඉතා ප්‍රකට වේ (EZ.Vol.III.1398-177). සිරි මේඝවරණ මහ රජතුමා එකල ඉන්දියාවේ රජ කළ සමුද්‍ර ගුප්ත අධිරාජ්‍ය සමග ද මිත්‍ර සම්බන්ධතා පැවැත්වූ බව රජුට අයත් අලහබාද් ප්‍රශස්ති ටැම් ලිපියේ සටහන් වේ. ඒ "දේවසුත්‍රෂාහි ෂහානුෂාහි ශක මුරුණ්ඩෛඃ සෛංහලකාදිභිශ්ච" වශයෙනි. එයින් දෛවසුත්‍ර, ෂාහි, ෂහානුෂාහි, ශක, මුරුණ්ඩ යන මොවුන් විසින් හා සිංහල දේශවැසියන්ය යන සියලු දීපවාසීන් විසින් වශයෙන් එම කොටස සිංහලට පරිවර්තනය කළ හැකිය. ඒ අනුව සිරි මේඝවර්ණාභය රජු සමඟ සමුද්‍රගුප්ත රජු සම්බන්ධතා පවත්වා ගෙන ගිය බවත්, එම රජු සමග මෙරට ජනයාගේ ගෞරව සම්බන්ධතාවයක් පැවති බවත් හෙළිවේ (Fleet.J.F:1398-08). බොහෝ විට ඉන්දීය රාජ්‍ය පාලනයේ බලතුලනය නිතරම ශ්‍රී ලංකාවට බෙහෙවින් බලපෑම් එල්ල කළ බැවින් සමුද්‍රගුප්ත රජ සමයේ සුහදතාවක් ගොඩනගා ගැනීම හැම විටම මෙරට රජුට යහපත පිණිසම හේතු වන්නට ඇත. කෙසේ වෙතත් ආගමික හා ජාතික වශයෙන් උපද්‍රව රහිතව ධාර්මිකව ඔහුගේ රාජ්‍යය කාලය ගෙවී ගිය බව නිගමනය කළ හැකිය.

සිරිමේඝවර්ණ රජුගෙන් පසු සිංහාසනයට පත් වූයේ එම රජුගේ කණිෂ්ඨ සොහොයුරු දෙවන (02) ජෙට්ඨතිස්ස රජතුමා ය (ක්‍රි.ව.328-337). මෙම දෙවන ජෙට්ඨතිස්ස රජුටම "සිරිමේඝ" නාමය ද ව්‍යවහාර කරන ලදි. ඇත්දත් කර්මාන්තයේ දක්ෂ එම රජු එය අන් අයට ඉගැන් වූ බවත් වෙහෙර විහාරවල එම කටයුතු කළ බවත් මහාවංශයේ දැක්වේ (ම.ව.37:101). එසේම ආගමික වශයෙන් කළ පින්කම් ආදිය ද සටහන් වේ. එහෙත් ජාතික වශයෙන් ආර්ථික වශයෙන් සශ්‍රීකමත් භාවය උදෙසා කළ යමක් පිළිබඳව සටහන් නොවේ. නව වසරක් එම රජුගේ රාජ්‍ය කාලය බලපැවැත්තේ ය.

අනතුරුව රජ වූයේ දෙවන ජෙට්ඨතිස්ස මහ රජුගේ පුත් බුද්ධදාස රජතුමාය (ක්‍රි.ව.337-365). මහාවංශයෙහි බුද්ධදාස රජුගේ වීර ක්‍රියාවන් ලෙස හඳුන්වා ඇත්තේ වෙදකම්හි පැවති දක්ෂ භාවයයි. දිවයිනේ විවිධ මිනිසුන්ට හා සත්වයින්ට වෙදකම් කළ රජතුමා ඒ සියල්ලන්ගේ ශාරීරික රෝග ද මානසික රෝගාබාධයන් ද සුවපත් කළහ යි වංසකථාව මහත් අභිරුචියෙන් වර්ණනා කරයි. තව ද රජතුමාගේ වෛද්‍ය ශාස්ත්‍රය පිළිබඳ දැනුමෙහි ප්‍රමාණය දක්වනු පිණිස "සාරාර්ථ සංග්‍රහය" නම් වෛද්‍ය ග්‍රන්ථය ද රචනා කළ බව දක්වා තිබේ (ම.ව.37:148). එසේම රජතුමා මොණර පිරිවෙන් මහා විහාර කරවීම ද ඊට ගම්මාන පූජා කිරීම ද ධර්මදේශනා පැවැත්වීම හා වැව් ඉදි කොට ආර්ථික තත්ත්වය උසස් කිරීමට ද ක්‍රියා කළ බව වංශකථාව වාර්තා කරයි. කෙසේ වෙතත් ආර්ථික තත්ත්වය කෙරෙහි ප්‍රධාන අවධානය යොමු කරනු ලබන මෙම පර්යේෂණයේ දී ඒ සඳහා ද රජ කළ කටයුතු ප්‍රමාණාත්මක බව සටහන් කළ යුතුය. මහාවංශ විස්තරයේ දී ඒ සඳහා ප්‍රමාණවත් තොරතුරු ප්‍රමාණයක් දැක්වීමට අපේක්ෂාවක් නොවූ බවත්, රජුගේ වෛද්‍ය වෘත්තීය ප්‍රාගුණ්‍යතාව සඳහා ම වැඩි ඉඩකඩක් යෙදූ බවත් මින් පැහැදිලි වේ. දිවයින පුරාම වෛද්‍ය ශාලා පිහිට වූ බව වාර්තා කරනුයේ ද ඒ සඳහාය. තව ද මිනිසුන්ට හා සත්වයින්ට බෙහෙත් කිරීම සඳහා වැටුප් දී වෛද්‍යවරුන් පත්කිරීම ද රජුගේ ක්‍රියාකාරකම් අතරත වේ (ලං.වි.වි.ල.ඉ.1964:279). රුවන්වැලි සෑ ටැම් ලිපියෙහි රජු හඳුන්වා ඇත්තේ "බුදදස මහසෙන" යන වදන්වලිනි. එයින් රජුගේ නාමයත් සිය සීයාගේ නාමයත් එකට එක්කරගෙන තිබෙන බව පෙනේ (EZ.Vol.III.1933(122). රාජාවලියෙහි මොරපාය, පැපිලිවෙහෙර ආදී විහාරයන් කළ බව ද සඳහන් වෙයි (රා.ව.1997:201). පූජාවලියෙහි සඳහන් වන්නේ දස ගමකට වෙදෙකු, නැකැත්තෙකු, බලිබතකු, බණකිසෙහි පණ්ඩිත කෙනකු බැගින් පත් කළ බවත් දැහැමෙන් සෙමෙන් රාජ්‍ය විචාළ බවත් ය (පූ.ව.2017:778). කෙසේ වෙතත් බුද්ධදාස රජු ආර්ථික වශයෙන් හා ආගමික වශයෙන් රට දියුණු කිරීම සඳහා ඔහුගේ වර්ෂ විසිනවයක් වූ දීර්ඝ රාජ්‍ය කාලය තුළ ක්‍රියා කොට තිබෙන බව පසක් වේ.

බුද්ධදාස රජු ඇවෑමෙන් රාජ්‍යත්වයට පත් වූයේ එම රජුගේ ජ්‍යෙෂ්ඨ පුත්‍ර උපතිස්ස කුමාරයා යි (පළමු උපතිස්ස) (ක්‍රි.ව.365-406).

එම රජු ඉතාමත් ධාර්මික වූ සීල සමාදානයෙහි නියුක්තව ක්‍රියාකරන උත්තමයෙක් ලෙස මහාවංශයෙහි හඳුන්වා දෙයි (ම.ව.130-132). මෙම රජු කළ කටයුතු අතර පලාවතු පිරිවෙන හා තෝපා වැව පිළිබඳව පූජාවලිය හා රාජාවලිය යන උභය ග්‍රන්ථයන්හි ම සටහන් වේ (පූ.ව.2017:778, රා.ව.1997:201). එහෙත් මහාවංශයෙහි එම රජු කළ කටයුතු රාශියක් විස්තර වශයෙන් දක්වා තිබේ. ඒ අතර මෙරට ආර්ථිකය නංවාලීම සඳහා වැව් රාශියක් ඉදිකළ බව සටහන් කොට ඇත. රජුපුල, ගිජුකුල, පොකුරුපස, මලහල, ඇඹිටිය, ගොඩිගමු වැව සකස් කළ බව ද එනමින් ආ විහාරය හා ඛණ්ඩරාජි විහාරය යන විහාර කළ බව ද මහාවංශය වාර්තා කරයි (ම.ව.37:137:189). මෙයින් එම රජුගේ රාජ්‍ය කාලය (වසර 42) ඉතා ඉහළින් පින්කම් කළ එසේම ආර්ථිකය නංවාලීමට මහා වැව් ආදිය ඉදිකළ හා ඉදිකොට ඇති වැව්වල ජලය ස්ථායි භාවයට පත් කළ කාලපරිච්ඡේදයක් වශයෙන් හඳුනාගත හැකිය. ඒ නිසා මෙම යුගය මෙරට ඉතිහාසයෙහි ආගමික හා ආර්ථික වශයෙන් වඩා වර්ධනයක් සිදු වූ කාල පරිච්ඡේදයක් වශයෙන් ද හඳුනාගත හැකිය. ගංගාරෝහණ නම් බුදුරුවක් රනින් නිමවා රතන සූත්‍රය දේශනා කරවා (බොහෝවිට අභිෂේක කරවා) දුර්භික්ෂ දුරු කළ අයුරු මහාවංශය (චූලවංශය) විස්තර සහිතව වාර්තා කරයි (ම.ව.37:191-194). ඊට අමතරව රජු කොරුන්ට, ගර්භණීන්ට, අන්ධයන්ට හා ලෙඩුන්ට සාත්තු කර වූ බවත්, ඒ සඳහා බෙහෙත්හල් ඉදිකර වූ බවත් මහාවංශයේ සටහන් වේ. වසර හතළිස් දෙකක් තරම් වූ දීර්ඝ කාල පරාසයක් රජකළ රජතුමා රටෙහි සාමය හා සෞභාග්‍යය ද පවත්වාගෙන යාමටත් රටවැසියා යහපතෙහි යෙදවීමටත් ඒ සඳහා තමා පළමුව යහපත් ගුණාංගයන්හි පුරුදු පුහුණුව නිති සිල් සමාදන් වීමටත් පුරුදුව සිටි බවත් පැහැදිලි කොට තිබේ. මේ නිසා උපතිස්ස රජුගේ රාජ්‍ය කාලය ආගමික හා ආර්ථික වශයෙන් මහත් දීප්තියක් ඇති කළ කාල පරිච්ඡේදයක් වශයෙන් හඳුනාගත හැකිය. තෝපා වැව හෙවත් පරාක්‍රම සමුද්‍රය එම රජු කළ වැව් වලින් එකක්යැ යි හඳුනාගෙන ඇති අතර අනෙක් වාරි කටයුතු ද වැව් ද හඳුනාගෙන නොමැත. එම රජුගේ මරණය සිදු වූයේ සිය මළණුවන් වූ පැවිදිව සිටි මහානාම කුමරු හා රහසින් පෙම් බැඳ සිටි සිය බිසව අතිනි.

අනතුරුව සිංහාසන ප්‍රාප්ත වූයේ මහානාම නම් රජුය. එම රජු සිය දෙටු සොහොයුරුගේ බිසව විවාහ කර ගත්තේය. පැවිදිව සිටි මහනාම උපැවිදිව රාජ්‍ය විචාරීම ද ලංකා ඉතිහාසයේ වැදගත් අවස්ථාවක් සනිටුහන් කරයි (ක්‍රි.ව.406-428). එම රජු ද සිය පිය රජු හා සොහොයුරු මෙන්ම ඉතා ධාර්මිකයෙකු බව මහාවංශයේ දැක්වේ. ආගමික වශයෙන් ලබා තිබූ ශික්ෂණය ඒ සඳහා හේතු වන්නට ඇති බව සැලකිය හැකි ය. මහානාම රජු පිළිබඳව පූජාවලිය හා රාජාවලිය යන ග්‍රන්ථද්වයේම ඇත්තේ එකම විස්තරයකි. එම රජු වසර විස්සක් (20) රාජ්‍ය විචාළ බවත්, බුද්ධඝෝෂ ආචාර්යවරයාගේ ආගමනය හා අටුවා පාලියට පරිවර්තනය කිරීමත් එම පරිවර්තිත අටුවා ගණනත් ඒ තුළ අන්තර්ගත වේ (රා.ව.1997:201, පූ.ව.2017,778). එහෙත් මහාවංසයෙහි ඊට වැඩි විස්තර ප්‍රමාණයක් අන්තර්ගත වේ.

මෙම රජුගේ රාජ්‍ය කාලයේ දී ගිලන්හල් කරවීමත්, මහපාලී නම් බත්හල හෙවත් දානශාලාව කරවීමත් පිළිබඳව මහාවංශයේ සටහන් වේ (ම.ව.37:209-2010). තව ද ඉතා වැදගත් තොරතුරක් මෙම රජුගේ රාජ්‍ය කාලයට අයත් ව මහාවංශයේ සටහන් වේ. එනම් ලොහොදොර කලපස, රලගමුව යන තුන් විහාර කරවා අභයගිරියට පූජා කිරීමයි. මේ වෙනවිට ද මහා විහාර, ජේතවන, අභයගිරි විහාර දාර්ශනික වශයෙන් විවිධ වෙනස්කම් සහිතව ධර්ම විනය පිළිබඳව බුදුසමය විෂයෙහි ආකල්පමය වශයෙන් විවිධත්වයෙන් පැවති බවට මෙය වැදගත් සාක්ෂියකි (එම:210). තව ද සිය බිසවගේ නමින් දුම්රක්කන්දෙහි විහාරයක් කරවා එය ථෙරවාදී භික්ෂූන්ට ලබාදුන් බව ද සටහන් කොට තිබේ (එම.211). මෙය ථෙරවාද මහායාන යන භේදය යම් මට්ටමකට පැවති බව සටහන් වන අවස්ථාවකි. " මහෙසියා නයෙනාදා භික්ඛූනං ථෙරවාදිනං" වශයෙන් පැහැදිලිව ම එය ථෙරවාදී භික්ෂූන්ට ප්‍රදානය කළ බව සටහන් වේ. එය එතරම් වැදගත් වන්නේ අභයගිරියෙහි හා ජේතවනයෙහි ද සිටි භික්ෂූන් මහායානිකයන්යැ යි කිසි විටෙක සටහන් නොවන බැවිනි. එබැවින් එහි සිටි ඇතැම් භික්ෂූන් වෛතුල්‍යවාදය ආදී මහායාන ඉගැන්වීම් වලට අනුකූලතාවය දැක්වූවා විනා එය ම පිළි ගැනීමක් පිළිබඳව වාර්තා නොවන බැවිනි.

මහානාම රජුගේ විසිවසරක් වූ රාජ කාලයට අයත් ව ලැබෙන අනෙක් වැදගත් කාරණය වන්නේ බුද්ධඝෝෂාචාර්යයන් වහන්සේගේ මෙරට සම්ප්‍රාප්තියත්, සිංහල අටුවා පාලියට නැගීම පිළිබඳ පුවතත් ය. ඒ සඳහා මහාවංශයෙහි දීර්ඝ විස්තරයක් අන්තර්ගත වේ. එහෙත් එලෙස නගන ලද (පරිවර්තනය කරන ලද) ප්‍රමාණය පූජාවලිය හා රාජාවලිය ගණන් වශයෙන් දක්වයි. එනම් බුදුන් වදාළ දෙලක්ෂ පන්සැත්තෑ දහස් දෙසිය පණස් ග්‍රන්ථ සංඛ්‍යාවක් ඇති ආගමයට තුන්ලක්ෂ එක් සැටදහස් සත්සිය පණස් ග්‍රන්ථ සංඛ්‍යාවක් පමණ අටුවා කථා ලියා (පූ.ව.2017,773, රා.ව.1997,201) වංශයෙන් එම ප්‍රමාණය දක්වා තිබේ.

බුද්ධඝෝෂාචර්යයන් වහන්සේ අටුවාකරණයෙහි යෙදුණු කාලයේ මෙරට රජකළ රජු වශයෙන් සටහන්ව ඇත්තේ " සිරිනිවාස" හෝ "සිරිකුඩ්ඩ" වශයෙන් හඳුන්වනු ලැබූ රජ කෙනෙකි. (ලං.වි.වි.ල.ඉ.1964:281) පරණවිතාණයන් මෙම වදන් දෙකට සිරි පාලිත, සිරිනිවාස යන අරුත් ලබා දේ. එසේම එම යුගයට අයත් දැනට සොයාගෙන ඇති ශිලා ලිපිවල ද "තිරිපල" යන නාමය දක්නට ලැබේ. එබඳු එක් ශිලාලේඛනයක් වන තිස්සමහාරාම පුවරු ලිපිය නූතනයේ කොළඹ කෞතුකාගාරයේ තැන්පත්ව තිබේ. එහි "බුදදස සිරිපල මහ නමික ජෙටතිස මහරජ" යන යෙදුම දිස්වේ. (Muller.E.1883(43) ඒ අනුව එම නමින්ද රජු හැඳින්වූ බවට සාධක දිස්වේ.

මීට අමතරව මෙම රජුගේ කාලයේ දී චීන දේශාටක පාහියන් හිමියන් ද මෙරටට සැපත් වූ බව විශ්වාස කරනු ලැබේ. උන්වහන්සේ විසින් මෙරට විසූ වසර දෙකක් තරම් වූ කාලපරිච්ඡේදය පිළිබඳ ලියන ලද විස්තරවලට මෙම රජුගේ රාජ්‍ය කාලය ගැලපේ. ගමන් විස්තරයේ මෙරට සැපත් වූ කාලපරිච්ඡේදය බුද්ධ පරිනිර්වාණයෙන් වසර 1497 ක් ඉක්මගිය අවධිය බව කියයි. එම වර්ෂ ක්‍රමය දක්වා ඇත්තේ චීන ලිත් ක්‍රමයක් පාදක කරගෙනය. ඒ අනුව මෙම දින වන විට ගතවී තිබෙන වර්ෂ ප්‍රමාණය වර්ෂ 956 වේ. එයින් බුද්ධ පරිනිර්වාණය ක්‍රි.පූ.544 දී සිදු වූ බවට පිළිගතහොත් ඒ වන විට ගත වී ඇති කාලය ක්‍රි.ව.410-412ට වැටේ. ඒ අනුව මෙම සිද්ධිය සටහන් කරන කාලයේ ලක්දිව රාජ්‍ය විචාරණ ලද්දේ මහානාම රජු බව පසක් වේ. (ෆා.දේ.වා. පරි.:2006:96) මහානාම රාජ්‍ය සමය වන විට මෙරට චීනය ඉන්දියාව

හා ආසියාව ඇතුළු ලෝකය සමග හොඳ ගනුදෙනු රටාවක් පැවති බවට ද මෙය කදිම සාධකයකි. මෙනිසා අංශ කිහිපයකින්ම මහානාම රාජ්‍ය කාලය බෙහෙවින් වැදගත් වේ.

මේ කාලය තුළ මෙරට ආර්ථික සමාජයීය මෙන්ම ආගමික වශයෙන් වැඩිදියුණු බවක් සිදු වූ බව පසක් වේ. විශේෂයෙන්ම බුද්ධදාස රජුගෙන් ඇරඹි සමාජ සේවා කටයුතු මෙම රජුගේ දෙපුතුන් ද අඛණ්ඩව කර ගෙන ආ බව සටහන් වේ. තව ද ප්‍රධාන වශයෙන් ආගම හා ආර්ථිකය පිළිබඳව වංශකථාවන්හි සටහන් වූ තොරතුරුවලට සමගාමීව සමාජයීය ක්‍රියාකාරකම් ද ජනහිත සම්බන්ධතා ආදිය ද මෙම යුගය තුළ මුහුකුරා යනු නිරීක්ෂණය කළ හැකිය. මේ නිසා ජාතික ආගමික ආර්ථික හා සමාජීය වශයෙන් ද ඉතා වැදගත් යුගයක් වශයෙන් මහානාම රාජ්‍ය කාලය හඳුනාගත හැකිය.

මහානාම රජුගේ අභාවයෙන් පසු ලංකා රාජ්‍යයෙහි ලම්බකරණ රාජ වංශයේ ද අවසානය සනිටුහන් වෙයි. මහානාම රජුට පුත්‍රයන් නොසිටි හෙයින් එම රජුගේ දෙමළ අග මෙහෙසියකට දාව උපන් සොත්ථිසේන රාජ්‍යත්වයට පත් විය. එහෙත් ඔහුට රජකම් කරන්නට ලැබුණේ එක් දිනක් පමණි. මහනාම රජුගේ මෙහෙසියකගේ දියණිය වූ සංඝා නම් කුමාරිකාවක විසින් සොත්ථිසේන රජු එදිනම මරණයට පත් කරන ලදි. ඇය තම ස්වාමි ඡත්තගග්ගාහක තනතුරු දැරූවහුට රාජ්‍යය පවරා දෙන ලද්දේය. ඔහු රජ කළේ එක් වර්ෂයක් පමණි. (ක්‍රි.ව.428) එම වර්ෂය ඇතුළත දී ද එම රජු ඡත්තහාහක නම් වැව බැන්දවීය. පරණවිතාන දක්වන ආකාරයට හෙතෙම ලම්භකරණ වංශයට අයත් තිස්ස නම් වූවෙකි. (ලං.වි.වි.ල.ඉ.1964:232) ඉන් අනතුරුව රජ වූයේ මිත්තසේන නම් රජ කෙනෙකි. (ක්‍රි.ව.428-429). ඔහු වංශකථාවෙහි හඳුන්වා ඇත්තේ වංචනිකයෙකු ලෙසිනි (ම.ව.38.5). ඉතා දුර්වලයෙක් වූ ඔහු ලෙඩෙකැ යි ද ඔහු රජගෙයි වස්සවා එම අමාත්‍යයාම රාජ්‍ය විචාළේ ය. එහෙත් එම රජුට ද රාජ්‍ය විචාරීමට හැකි වූයේ එක් වර්ෂයක් පමණි. එහෙත් එම කාල පරිච්ඡේදය තුළ ද එම රජු මහා සෑ තුනෙහි ඇත් පවුරු ආදිය කළ බව වංසකථාවේ සටහන් වේ. ඒ අතර දකුණු ඉන්දියාවෙන් පැමිණි පණ්ඩු නම් වූ ද්‍රවිඩ රජෙක් මිත්‍රසේන රජු මරා පාලන බලය අල්ලා ගත් බව මහාවංසයෙහි සටහන් වේ (ම.ව.38:12).

කෙසේ වෙතත් ලම්බකර්ණ රජ පෙලපත මෙයින් අවසන් වූ බව පෙනෙයි. වසභ රජුගෙන් ආරම්භව වර්ෂ තුන්සිය හැට තුනක් (363) තරම් දීර්ඝ කාලයක් රාජ්‍ය විචාළ එම රාජවංශය මහනාම රජුගෙන් අවසන් වූ බව මෙයින් පැහැදිලි වේ. මෙරට ආර්ථිකය හා රටවැසියාට ආගමික සාමාජික මෙන් ම හිතවාදී පාලන තන්ත්‍රයක් එම රාජවංශය ගෙන ගිය බව මෙහිදී පසක් කරගත හැකිය. මෙම රාජවංශය පැවති කාලය තුළ සතුරු අවුල් වියවුල් අභ්‍යන්තර හෝ බාහිර වශයෙන් වැඩි වශයෙන් ඇති නොවීම ද මෙහිදී එම රාජවංශයේ පැවති හිතවාදී පාලන ක්‍රමය විදේශීය ප්‍රතිපත්තියේ ද ශක්තිමත් භාවයක් ප්‍රකට කරයි.

ලම්භකර්ණ වංශික රජවරුන් පිළිබඳව විමසීමේ දී පෙනී යන්නේ එම රජවරු රටෙහි ආර්ථිකය ශක්තිමත් කිරීමට හා ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීම සඳහා බෙහෙවින් උනන්දු ව ක්‍රියා කළ බවයි. වසභ හා මහාසේන වැනි රජවරු විශාල වැව් ප්‍රමාණයක් හා ඇලවල් ප්‍රමාණයක් සාදා රටෙහි ජීවන රටාව හා කෘෂි ආර්ථිකය නැංවීම උදෙසා ක්‍රියා කළහ. මෙකී සියලු වාරි ව්‍යාපාර මුළු රට ම ආවරණය වන ලෙස ඉදිකළ බව දැනට හඳුනාගෙන ඇති වැව් ආදිය පමණක් සලකා බැලූව ද ප්‍රත්‍යක්ෂ වේ. රජරට හා ප්‍රාචීන දේශයෙහි ආර්ථික දියුණුව පිළිබඳව විශේෂයෙන් සලකා බැලූ මෙම රජවරු කෘෂි ආර්ථිකය වඩාත් ශක්තිමත්ව කළ හැකි ප්‍රදේශ පිළිබඳ වැඩි අවධානයක් යොමු කොට තිබේ. අනෙකුත් රජවරු එකී වාරි ව්‍යාපාර පවත්වාගෙන යාමෙන් හා නව වාරි ව්‍යාපාර ආරම්භ කිරීමෙන් මීට දායක වූහ. ජනයාගේ සෞභාග්‍යය පිළිබඳව අවධානය යොමු කළ මෙම රජවරු ආරෝග්‍ය ශාලා ඉදි කිරීමෙන් මිනිස් හා සත්ත්ව යන දෙපිරිසට ම වෙදකම් කිරීමටත් අවශ්‍ය කටයුතු සාධනය කළහ. බුද්ධදාස රාජ්‍ය කාලයේ ගමක් පාසා වෛද්‍ය ශාලා ඉදි කිරීමෙන් ද ඒවාට වෛද්‍යවරුන් පත් කිරීමෙන් ද අඛණ්ඩ සෞඛ්‍ය සේවයක් ලබාදීමට ක්‍රියා කොට තිබේ. හොරුන්ට හා අන්ධයින්ට විශේෂ වූ නිවාස ද ඇතුන් අසුන් හා යුද්ධ භටයින් සඳහා විශේෂ වෛද්‍යවරුන් ද පත් කොට සිටි අතර සමස්ත ජනතාවගේම සෞඛ්‍යාරක්ෂිත බව පිළිබඳව බෙහෙවින් අවධානය යොමුකොට තිබේ. ගම් දහයකින් (10) යුක්ත කොට්ඨාස වෙන් කොට ඒ ඒ කොට්ඨාස සඳහා නිල වෛද්‍යවරයෙක් බැගින් පත් කිරීමට ද එම වෛද්‍යවරුන්ගේ යැපීම සඳහා කෙත් දහයක් බැගින් වෙන් කොට දී තිබීමෙන් ද ඒ බව

පැහැදිලි වේ (ම.ව.37:14-148). මෙය රාජ්‍යය වියදමින් අඛණ්ඩ වෛද්‍ය සේවයක් සැපයීම සඳහා ගත් උත්සාහයකි. මෙරට ඉතිහාසයෙහි එබන්දක් පිළිබඳව සටහන් වන්නේ පළමු වතාවටයි.

ලම්බකර්ණ රාජ වංශිකයන් අතර වසභ, වෝහාරිකතිස්ස, ගෝඨාභය, සිරි මේඝවර්ණ හා බුද්ධදාස යන රජවරු මෙම යුගයේ පාලන කාර්යයේදී ත්‍යාගශීලී හා ජනතාවට අනුග්‍රහශීලී ක්‍රියා පිළිවෙතක් අනුගමනය කළ බව පසක් වේ. මහසෙන් රජු හා අනතුරුව රජ පැමිණි රජවරුන් ද ජනතා සේවය සැලසීම අතින් ඉතා උසස් තත්වයක සිටියහ. එහෙත් මහා විහාර අභයගිරි භික්ෂූන් අතර වූ ආගමික පරස්පරතාදියේදී පක්ෂග්‍රාහීව කටයුතු කිරීම යම් ව්‍යාකූලතා ඇතිවීමට හේතු වී තිබේ. එහෙත් පාලන කාර්යයේ දී ඔවුන් ඉතා බලවත් හා ශක්ති සම්පන්න භාවය ම ප්‍රකට කළහ.

ලම්බකර්ණ රජවරුන්ගේ විදේශ ප්‍රතිපත්තිය පිළිබඳව විමසීමේ දී ද පෙනී යන්නේ ඉතා ඥාණවන්ත ශක්තිමත් විදේශ ප්‍රතිපත්තියක් ඔවුන් ගෙන ගිය බවයි. දකුණු ඉන්දියාවේ රජවරුන් සමග සමීප සම්බන්ධතා ලම්බකර්ණ රාජ වංශිකයන්ට තිබුණි. නාගාර්ජුනකොණ්ඩ විහාරස්ථානය ආශ්‍රිත ශිලා ලේඛන පරීක්ෂා කිරීමෙන් පෙනී යන්නේ එම යුගයේ හෙවත් ක්‍රිස්තු වර්ෂ දෙවන තෙවන සියවස්වල ලංකාව හා සම්බන්ධතා බෙහෙවින් පැවති බවයි. සිරි වීරපුරිස දත රජුගේ රාජ්‍ය අවධිය මෙහිලා කැපී පෙනේ. එම යුගය බොහෝ විට ක්‍රිස්තු වර්ෂ දෙවන සියවස නියෝජනය කරයි. මහායානිකයන් වැඩි වශයෙන් වාසය කළ නාගාර්ජුනකොණ්ඩයෙහි හීනයානිකයින් වෙනුවෙන් ද විහාරස්ථාන ඉදි කොට දී තිබුණි. එහි දැක්වෙන ආකාරයට "තේරම් ආචාරියානම් කාස්මීර ගම්ධාර චීන චිලාත තෝසාලි අවරම්ත වම්ග වනවාසී යවන දමිල පලුර තම්බපම්ණිදීප පාසාදකානම් ථෙරියානම් තම්බපන්‍යකානම් සුපරිගහෙ" (EZ.Vol.III.1930(22). මෙම තොරතුරුවලින් සනාථ වන්නේ ලම්බකර්ණයින්ගේ රාජ්‍ය අවධියේ ආගමික වශයෙන් දකුණු ඉන්දීය බෞද්ධයන් සහ එම බෞද්ධ හෝ බෞද්ධයන්ට අනුග්‍රහ කළ රාජකීයයන් සමග සමීප සම්බන්ධතා පැවති බවයි. තව ද මහසෙන් රජුට ශාස්ත්‍රෝද්ග්‍රහණය කළ සංඝමිත්‍ර භික්ෂුව චෝල දේශයෙන් පැමිණි බව මහාවංශය දක්වා තිබේ (ම.ව.36:113). බුද්ධඝෝෂාචාර්යයන් වහන්සේ ද මහානාම රාජ්‍ය

කාලයේ මෙරටට සැපත් වන අතර උන්වහන්සේගේ ජන්මභූමිය බෝමැඩ නොවන බව විසුද්ධිමග්ග නිදාන කථාවෙහි දැක්වේ. ජාති දේස විවරණයේ දී දැක්වෙන්නේ "බුද්ධඝොසො බොධිමංඩල සමීපෙ (බුද්ධගයායං) ජාතොතින යුත්තමේතන්ති වත්වා'' "....තං කාලිකානි මාගධිකානි වත්ථූනි න පකාසෙන්ති, තථෙව සීහලිකානිපි දක්ඛිණ ඉන්දීය රට්ඨිකානිපි" (වි.ම.ජාතිදෙස විවරණ-ඡට්ඨ සංගායනා) එහෙත් සාසනවංශදීපිකාවෙහි දැක්වෙන්නේ එම හිමියන් එම හිමියන් බෝධි රුක සමීපයේ ඝොගගමේ තිස්ස නාම බ්‍රාහ්මණකෙසියා නාම බ්‍රාහ්මණියා...." වශයෙන් සංසනවංසදීපිකාවෙහි දැක්වෙන්නේ එම හිමියන් '' බෝධිරුක්ඛ සමීපෙ ඝොසගාමේ කෙසිය නාම බ්‍රාහ්මණස්ස කේසියා නාම බ්‍රාහ්මණියා...'' වශයෙනි. එයින් උන් වහන්සේගේ උප්පත්තිය සිදු වූයේ ලුම්බිණිය සමීපයේ බව කියවේ. (එමඃසාසනවංසදීපිකාඃදීපල දීපක සාසනවංසකථා වග්ගෙ ා්...'' කෙසේ වෙතත් බුද්ධඝෝෂ හිමියන් කාංචි පුරයත් සමග කිට්ටු සම්බන්ධතාවයක් පවත්වාගත් බව හෙළිවේ. එයින් මහනාම රාජ්‍ය අවධියේ (ක්‍රි.ව.406-428) දකුණු ඉන්දීය ප්‍රදේශය සමග පැවති සම්බන්ධතා ද හෙළිවේ. (ගුණසිංහ.පී.ඒ.1964ඃ256) එසේම සාරිපුත්ත, බුද්ධදත්ත යන අටුවාචාරීන් වහන්සේලාගේ ජන්ම භූමිය චෝල දේශය බව මලලසේකර කියයි. මෙයින් බුද්ධදත්ත හිමියන් දකුණු ඉන්දීය චෝල රාජ්‍යයේ කාවේරියේ ය (Malalasekara.1953:107). මෙලෙස ආගමික සම්බන්ධතාවලදී චීනය හා ඉන්දියාව සමග ලම්බකර්ණ රාජ වංශික රජවරු ඉතා විචක්ෂණශීලී විදේශ ප්‍රතිපත්තියක් පවත්වාගෙන ගිය බවට සාධක තිබේ.

ලම්භකර්ණ වංශික රජවරුන්ගේ ඈත පෙරදිග රටවල් අතර පැවති වෙළෙඳ සම්බන්ධතා සම්බන්ධයෙන් ද විමසීමේ දී පෙනී යන්නේ හොඳ සහසම්බන්ධයක් පැවති බවයි. චීනය සමග ක්‍රිස්තු වර්ෂාරම්භයත් සමගම ඉතා හොඳ සම්බන්ධතාවක් පවත්වාගෙන ගිය බව පසක් වේ. විශේෂයෙන් මෙරට දූතයන් විසින් ඇත්දත්, මීහරක් සහ මොල්ලි සහිත ගවයන් චීනය වෙත ගෙන ගිය බවට වාර්තා පවතී (RASL.Vol.XXIV.197:107). ක්‍ර.ව. 12 දී සහ 121 දී ද මෙලෙස දෙරට අතර ත්‍යාග හුවමාරු කිරීමක් පිළිබඳව සටහන්වී තිබේ. ක්‍රි.ව.405 දී ලක්දිව රජ කළ දෙවන උපතිස්ස රජු චීන අධිරාජයා වූ හිසෝ ඕති (Hiso-Ou-Ti) වෙත මහැඟි බුදුපිළිමයක් ත්‍යාග කොට

තිබේ (ibid:108). ක්‍රි.ව.412 දී පාහියන් භික්ෂුව මෙරටට පැමිණි බව බෙහෙවින් ප්‍රකට කරුණකි. ක්‍රි.ව. 426 දී තන්ක්‍රින් නගරයට භික්ෂුණීන් සැපත් වූ බව වාර්තා වී තිබේ. බොහෝ විට භික්ෂුණී සාසනය යළි පණගැන්වීම එහි අරමුණ විය. කි.ව. 428 දී මහානාම රජ චීන අධිරාජයා වෙත දන්ත ධාතුන් වහන්සේගේ ආකෘතියක් ත්‍යාග කර ඇත. (ibid) ක්‍රි.ව. 429 සිට 456 දක්වා වරින් වර මෙරට භික්ෂූණීන් චීනයට ගමන් කොට ඇත. ඔවුන් එහි භික්ෂුණී ශාසනය පිහිට වූ බවට ද වාර්තා තිබේ.

## නිගමනය

ආර්ථික හා සමාජීය වශයෙන් මෙන්ම ආගමික වශයෙන් ද දිවයින ඉතා ශක්තිසම්පන්න ස්ථානයකට ඔසවා තැබීමට ලම්භකර්ණ වංශිකයන්ට හැකි වූ බව මෙම තොරතුරවලියෙන් සනාථ වේ. එම රාජ පරම්පරාවේ සියලුම රජවරු ඉතා ක්‍රියාශීලී කාර්යක්ෂම රාජ්‍ය පාලන කෘත්‍යක යෙදී සිටි බව ද ප්‍රකට වේ. මේ නිසා ලම්බකර්ණ වංශික රජවරු මෙරට පාලන කාර්ය සඳහා වඩාත් ජනහිතකාමී පාලන ක්‍රමවේදයක් හඳුන්වා දෙනු ලැබූ බව පිළිගැනීමට සිදුවේ.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

01 *අනුරාධපුර යුගය*, අමරදාස ලියනගමගේ, රණවීර ගුණවර්ධන සංස්. (1965), ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය, කොළඹ

02 අලගියවන්න පුවසති, *සංස්කෘත සිංහල ශබ්ද කෝෂය*, (2004), සූරිය ප්‍රකාශකයෝ, කොළඹ

03 *ඤාණෝපායිනී*, ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ 71 වැනි උපසම්පදා පුණ්‍යෝත්සව සමරු ශාස්ත්‍රීය සංග්‍රහය, (2018) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ

04 *දීපවංශය*, කිරිඇල්ලේ ඤාණවිමල ස්වාමීන්ද්‍ර පරි. (1959), සීමාසහිත ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ

05 *දීපවංශය*, ප්‍රසාද් ෆොන්සේකා සංස්. (2019). බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල

06 *බෞද්ධ රාජධානි පිළිබඳ තොරතුරු නම්වූ ෆාහියන්ගේ දේශාටන වාර්තාව*, බලගල්ලේ විමල් ජී. පරි.(2006), විසිදුනු ප්‍රකාශකයෝ, බොරලැස්ගමුව

07 බුද්ධදත්ත හිමි පොල්වත්තේ, *පාලි සිංහල අකාරාදිය* (1998), බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල

08 *මහාවංශය* හික්කඩුවේ ශ්‍රී සුමංගල මාහිමි, බටුවන්තුඩාව පරි. (2012), බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල

09 *පූජාවලිය*, කිරිඇල්ලේ ඥාණවිමල නාහිමි සංස්. (2017), සීමාසහිත ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ

10 *රාජාවලිය*, සුරවීර ඒ.වී. සංස්. (1997), අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, කොළඹ

11 *ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය*, සිංහල පරි. හේමචන්ද්‍ර රාය ප්‍රධාන සංස්. විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ සිංහල පරිවර්තනය, (1964), විශ්වවිද්‍යාල ප්‍රකාශනය

12 *වංසත්ථප්පකාසිනී*, මහාවංශ ටීකාව, අකුරටියේ අමරවංස නාහිමි, හේමචන්ද්‍ර දිසානායක සිංහල පරි. (2001), එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ

13 විමලබන්ති හිමි ජී, *මහල්ලකනාග රජුගේ අප්‍රකාශිත කයිලෑව පුවරු ලිපිය*, (2021), (මුද්‍රණයේ)

14 සාහිත්‍ය මණ්ඩලීය ලිපිමාලා අංක 01, *ලංකා ඉතිහාසය*, (1967), ශ්‍රී ලංකා සාහිත්‍ය මණ්ඩලය, කොළඹ

15 *Archaeological Survey of Ceylon Annual reports*, (1934), Department of Archaeology, Colombo

16 *Corpus Inscriptionum Indicarum*, Vol. III, Fleet, J.F. (1888), Printed by the Superintendent of Government Printing, India

17 *Epigraphia Indica*, Vol. XX, Vogal J.P.H., (1983) Reprint, Director of Archaeological survey of India, New Delhi

18 *Epigraphia Zeylanica*, Vol. IV, (1943)Edited by Paranavitana Senarath, Published for the Government of Ceylon by Humpherey Milford, Oxford University Press, London

19 *Epigraphia Zeylanica*, Vol. III, (1933), Edited by Paranavitana Senarath, Published for the Government of Ceylon by Humpherey Milford, Oxford University Press, London

20 Muller E., *Ancient Inscriptions in Ceylon*, (1883), Trubner and Co. Ludgate Hill, London

21 Malalasekara G.P., *The Pali Literature of Ceylon*, (1958), m.D. Gunasena and Co. Ltd, Colombo

22 Paranavitana S. *Inscriptions of Ceylon*, Vol II, Part I, (1983), Published by the Department of Archaeology, Sri Lanka

23 Paranavitana S., *Inscriptions of Ceylon* Vol II, Part II, (2001), Published by the Department of Archaeology, Sri Lanka

24 *Royal Asiatic Society Journal of the Ceylon Branch*, Vol. xxiv, No. 68, Part I, (1917), The Colombo Apothecaries Co. Ltd, Colombo